# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 90 — 1973 දෙසැම්බර් 14 වැනි සිකුරාදා — 1973.12.14

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය — සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය ... | 1245 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත් කිරීම් ආදිය ... | 1246 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කරන පත් කිරීම් ආදිය ... | — |
| අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත් කිරීම් ආදිය... | 1246 |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 1249 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත් කිරීම් ආදිය ... ... | — |

| | පිට |
|---|---|
| ආණ්ඩුවේ නිවේදන — ... ... | 1251 |
| මිළ පාලන දැන්වීම් ... — ... | — |
| ශ්‍රී ලංකා මහා බැංකුවේ දැන්වීම් — ... | — |
| ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා — ... | 1257 |
| ආණ්ඩුවේ වත්කම් හා බැරකම් ප්‍රකාශන — ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... — ... | 1260 |
| " සුරාබදු ආඥාපනත " පිළිබඳ දැන්වීම් ... ... | — |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 45 දරන ලොරි බලකර ලබා ගැනීමේ සහ අත් කර ගැනීමේ පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 46 දරන ධීවර (සංශෝධන) පනත 1973 දෙසැම්බර් මස 14 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළවේ.

## ජනාධිපතිතුමාණන් විසින් කරන පත් කිරීම් ආදිය

**1973 අංක 567**

අංකය : ඩී. 297/ආර්ඊසීපී.

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද පත් කිරීමක්**

බටහිර පෙදෙස ආඥාපති කර්නල් ඊ. ටී. ද ඉසෙඩ්. අබේසේකර, ඔහුගේ වතමන් රාජකාරි වලට අමතරව 1973 නොවැම්බර් මස 01 වෙනි දින සිට යුද්ධ හමුදා මූලස්ථානයේ මාණ්ඩලික ප්‍රධාන වශයෙන් වැඩ බැලීමට.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 5 වැනි දින,
කොළඹ දීය.

12-549—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**1973 අංක 568**

අංකය : ඩී. 250/ආර්ඊසීපී/3(IV)

**යුද්ධ හමුදාව—ස්ථිර බල හමුදාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද උසස් කිරීමක්**

පහත නම සඳහන් නිලධාරියා 1973 ජූනි මස 01 දින සිට තාවකාලික මේජර් වශයෙන් :—

කපිතාන් ආර්. ජයවර්ධන, ලයුයුබ.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් 4 වැනි දින,
කොළඹ දීය.

12-537—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාදවී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

### 1973 අංක 569

අංකය : ඩී/වීඑප්/42 (III).

**ශුද්ධ හමුදාව—ශ්‍රී ලංකා ස්වේච්ඡා බලසේනාව—ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් අනුමත කරන ලද නිලයෙහි ස්ථිර කිරීම් හා උසස් කිරීම්**

1973 ජනවාරි මස 01 වැනි දින සිට මේජර්වරුන් වශයෙන් :—

කපිතාන් (තාවකාලික මේජර්) පීටර් ඇල්ෆ්‍රඩ් ද මෙල්, ඊ. ඩී., ලංජාආමු.

කපිතාන් ක්ලෙරන්ස් ෂෙල්ටන් ඇන්තනි පෙරේරා, ලංජාආමු.

කපිතාන් සමරරත්න විදානආරච්චිලාගේ රත්නපාල සේනාරත්න, ලංජාආමු.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් 27 දින,
කොළඹදීය.

12–463—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 570

අංකය ඩී/වීඑප්/18/ඒ (IV)

**ශ්‍රී ලංකා නාවික හමුදාව—ස්වේච්ඡා නාවික හමුදා බලකාය ජනාධිපති උතුමාණන් වහන්සේ විසින් පිළිගන්නා ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීම**

පහත නම් සඳහන් නිලධාරියා 1973 ඔක්තෝබර් 17 දින සිට ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදා බලකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම ජනාධිපති උතුමාණන් විසින් පිළිගෙන ඇත.

වැඩ බලන උප ලුතිනන් සී. එල්. වීරරත්න, ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව.

උතුමාණන් වහන්සේගේ අණපරිදි,

වී. ටී. ජයසිංහ,
රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් 27 දින,
කොළඹදීය.

12—462—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## අමාත්‍ය මණ්ඩලය විසින් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 571

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම් කර ඇත :—

අංකය : අමප. අ.96/72.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, ඩබ්ලිව්. එම්. සී. ඩබ්ලිව්. එම්. අපොන්සෝ මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ සහකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, කපිතාන් සී. එච්. එස්. අමරසේකර මහතා තම රාජකාරිවලට අමතරව 1973 අප්‍රේල් මස 11 වැනි දින සිට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. අ.96/72.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, ඩබ්ලිව්. එම්. සී. ඩබ්ලිව්. එම්. අපොන්සෝ මහතා දිවයිනෙන් බැහැරව සිටි කාලය තුළ, සහකාර සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ, කපිතාන් සී. එච්. එස්. අමරසේකර මහතා තම රාජකාරිවලට අමතරව 1973 අගෝස්තු මස 28 වැනි දින සිට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ වශයෙන් වැඩ බැලීමට.

අංකය : අමප. 386/73.

එල්. බී. අබේරත්න මහතා 1973 සැප්තැම්බර් මස 1 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වශයෙන්.

අංකය : අමප. 378/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ, අයි. සමරවික්‍රම මහතා 1973 අගෝස්තු මස 29 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු වාණිජ අධ්‍යක්ෂ වශයෙන්.

අංකය : අමප. 378/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩබ්ලිව්. ඇස්. පී. ජයසූරිය මහතා 1973 අගෝස්තු මස 29 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු මිල පාලක (ආහාර හා විවිධ ද්‍රව්‍ය) වශයෙන්.

අංකය : අමප. 443/73.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ ඊ. ජේ. ද සිල්වා මහතා 1973 සැප්තැම්බර් මස 17 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් වශයෙන්.

අංකය : අමප. 483/73.

දුම්රිය සාමාන්‍යාධිකාරී එන්. එම්. වී. ටී. නවරත්න මහතා දිවයිනෙන් බැහැරව සිටින කාලය තුල ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ ඒ. ටී. ජේ. මඩුගල්ලේ මහතා තම රාජකාරිවලට අමතරව 1973 සැප්තැම්බර් මස 10 වැනි දින සිට දුම්රිය සාමාන්‍යාධිකාරී වශයෙන් වැඩ බැලීමට.

එම්. එෆ්. අලීෆ්,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය,
ජනරජ ගොඩනැගිල්ල,
කොළඹ,
1973 නොවැම්බර් 30 දින.

12–539—73.12. 14දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## අධිකරණ සේවා උපදේශක මණ්ඩලයෙන් කරන පත්කිරීම් ආදිය

### 1973 අංක 572

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 (5) වැනි වගන්තිය ප්‍රකාර අමාත්‍ය මණ්ඩලය විසින් අධිකරණ සේවා උපදේශක මණ්ඩල ලේකම් වෙත පවරන ලද බලතල යටතේ පහත සඳහන් වැඩ බැලීමේ පත්කිරීම් කර ඇත :—

1. එම්. ඉසෙඩ්. අයි. අසීස් මහතා 1973 දෙසැම්බර් මස 01 වැනි දින සිට නැවත නියමයක් කරන තෙක්, අධි සංඛ්‍ය නිලධාරියකු වශයෙන් සහ මොරටුව ක්‍රියා කරන පානදුර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන හා අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

2. ඩබ්ලිව්. ජී. එන්. වීරත්න මහතා 1973 දෙසැම්බර් මස 01 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක්, අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ මීගමුවේ අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

3. ඒ. එල්. එම්. ප්‍රනාන්දු මහතා 1973 දෙසැම්බර් මස 01 දින සිට නැවත නියෝගයක් කරන තෙක්, මාතර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

4. බී. එම්. එෆ්. ඒකනායක මහතා 1973 දෙසැම්බර් මස 01 දින සිට නැවත නියෝගයක් කරන තෙක්, අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ බදුල්ල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක නාගරික මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

5. ආර්. බී. රණරාජා මහතා 1973 දෙසැම්බර් මස 01 වැනි දින සිට නැවත නියෝගයක් කරන තෙක්, අධිසංඛ්‍ය නිලධාරියෙකු වශයෙන් සහ කුලියාපිටිය පළාත් ආණ්ඩු සීමාව තුළ කනදුල්ලේ පිහිටි උසාවියේ කුරුණෑගල අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන වශයෙන් වැඩ බැලීමට.

6. ආර්. ඉලෙපෙරුම මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු, එම්. ඩබ්ලිව්. ආර්. ද සිල්වා මහතා 1973 නොවැම්බර් මස 15 සිට 17 දින දක්වා සහ 19 සිට 21 දින දක්වා ගම්පොල ක්‍රියා කරන මහනුවර අතිරේක මහෙස්ත්‍රාත් තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන, ගම්පොල අතිරේක මහෙස්ත්‍රාත් තැන සහ අතිරේක ළමා මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

7. ඒ. ඩබ්ලිව්. ගුණරත්න මහතා නැති අතර හෝ නැවත නියමයක් කරන තුරු පී. එස්. පී. ද එස්. ගුණසේකර මහතා 1973 නොවැම්බර් මස 29 සහ 30 යන දිනයන්හි බලපිටියේ අතිරේක දිස්ත්‍රික් නඩුකාර තැන, අතිරේක රික්වෙස්ට් කොමසාරිස් තැන සහ අතිරේක මහෙස්ත්‍රාත් තැන වශයෙන් වැඩ බැලීමට.

32. ජේ. එච්. කරුණාරත්න මහතා යටිකහ දකුණු කෝරලේ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

33. ඊ. ඇම්. පුංචිබණ්ඩා මහතා මයුරාවතී කෝරලේ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

34. අයි. ඇම්. පී. බී. අබේසිංහ මහතා යටිකහ උතුරු කෝරලේ ප්‍රදේශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය දරණ කාලය තුළ කුරුණෑගල අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

35. අනුලා දිසානායක ඩයස් මහත්මිය කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරියක වශයෙන් ද;

36. එම්. එස්. බී. ප්‍රනාන්දු මහතා ශ්‍රී ලංකා ගුවන් හමුදා දෙපාර්තමේන්තුවේ සිවිල් පාලන නිලධාරී ධුරය දරණ කාලය තුළ කොළඹ අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

37. ඒ. සී. සයිමන් මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

38. සී. ඊ. පතිරාජ මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

39. ආර්ලිස් කළුගලආරච්චි මහතා කළුතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

40. සන්තියාගු ඩැනියල් ද සිල්වා මහතා මහනුවර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

41. නීතිඥ සී. ඊ. ඒ. ගුණසේකර මහතා නුවරඑළිය අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සාමදාන විනිශ්චයකාර වරයෙකු සහ නිල නොලත් මහේස්ත්‍රාත් වරයෙකු වශයෙන් ද;

42. නන්දදාස ජේ්වා බැට්ටගේ මහතා මාතර අධිකරණ දිස්ත්‍රික්කය සඳහා සමදාන විනිශ්චයකාර වරයෙකු වශයෙන් ද;

පත් කරමි.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
අධිකරණ ඇමති.

1973 දෙසැම්බර් මස 07 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–533—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 574

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා4/හමප 14/8.

1. එම්. අයි. ආර්. කාරියප්පර් මහතා 1973 ඔක්තෝබර් මස 10 වැනි දින සිට, අම්පාර දිස්ත්‍රික්කයේ කරවාහුපත්තු දකුණ කොට්ඨාශය සඳහා හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : පා4/හමප 16/27.

2. ලංසකාර ජයසුන්දර මුදියන්සේලාගේ කපුරු බණ්ඩා මහතා. 1973 නොවැම්බර් මස 06 වැනි දින සිට, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුවන්නා කෝරළයේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

අංකය : පා4/හමප 16/28.

3. විජේකෝන් මුදියන්සේලාගේ ගුණරත්න මහතා, 1973 නොවැම්බර් මස 06 වැනි දින සිට කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහළ විසි දෙක කෝරළය සඳහා හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් ද,

පත් කරනු ලැබ ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 දෙසැම්බර් මස 07 වෙනි දින,
කොළඹ—අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12–532—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

(20 වැනි පරිච්ඡේදය වන) ක්‍රිමිනල් නඩු විධාන සංග්‍රහයේ 120 වැනි වගන්තිය යටතේ අධිකරණ ඇමතිතුමා විසින්—

අංකය : පා4/හමප 1/22.

1. ඩී. බී. අප්පුහාමි මහතා පොලොන්නරුව දිස්ත්‍රික්කයේ සිංහල පත්තුවේ හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් කර ඇති පත්වීම ද,

2. අයි. ඩී. එස්. ප්‍රනාන්දු මහතා ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ප්‍රදේශය සඳහා හදිසි මරණ පරීක්ෂක වරයෙකු වශයෙන් කර ඇති පත්වීම ද,

වහාම ක්‍රියාත්මක වන සේ අවලංගු කර ඇත්තේ ය.

නිහාල් ජයවික්‍රම,
අධිකරණ ලේකම්.

1973 දෙසැම්බර් මස 07 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දීය.

12–531—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## 1973 අංක 575

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ, ආර්. පී. ගෝමස් මහතා 1973. 10. 07 දින සිට නැවත නියමයක් කරනතුරු, පරිපාලන අභ්‍යාස අධ්‍යක්ෂ සහ පරිපාලන අභ්‍යාස ආයතනයේ විද්‍යාලයාධිපති වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 1 වැනි පන්තියේ II වැනි ශ්‍රේණියේ, ඩබ්ලිව්. ජේ. ආර්. නවගමුව මහතා 1973. 10. 02 දින සිට නැවත නියමයක් කරනතුරු, සෞඛ්‍ය අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, ඩබ්ලිව්. ඩී. ඩී. තිලකරත්න මහතා 1973.09.04 දින සිට නැවත නියමයක් කරනතුරු, වාරිමාර්ග, විදුලිබලය හා මහාමාර්ග අමාත්‍යාංශයට අනුයුක්තව සිටීමට.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වැනි පන්තියේ, පී. කේ. දිසානායක මහතා 1973. 10. 15 දින සිට නැවත නියමයක් කරනතුරු, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ එස්. ආර්. ජී. ක්ලින්ටන් මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, ජාතික නිවාස සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ටී. ලංකානේසන් මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කයේ කින්නියා කොට්ඨාශයේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එන්. වේදාරන්‍ය සේයෝන් මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, ත්‍රිකුණාමලය පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියා කරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, වී. කේ. නානායක්කාර මහතා 1973. 10. 10 දින සිට නැවත නියමයක් කරනතුරු, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, කේ. සෙල්වරත්නම් මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, මන්නාරම පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්තවරයාගේ විධානය පිට ක්‍රියාකරන එකී පාලන දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ සහකාර ඒජන්ත වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. ඇම්. ඇම්. අබේරත්න මහත්මිය 1973. 10. 01 දින සිට මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සිටීමට සහ 1973. 10. 03 වැනි දින සිට නැවත නියමයක් කරනතුරු, මෝටර් රථ ප්‍රවාහණ සහකාර කොමසාරිස් වරියක වශයෙන්.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් 09 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය, කොළඹ 7.

12–356—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### 1973 අංක 576

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පහත සඳහන් පත්වීම් කර ඇති බව දැනුම් දෙනු ලැබේ :—

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, පී. බී. වේරගොඩ මහතා 1973. 01. 23 දින සිට නැවත නියමයක් කරන තුරු, සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහකාර ලේකම් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. සෝමසුන්දරම් මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු. මඩකලපු පාලන දිස්ත්‍රික්කයේ කෝරළේ පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. එස්. එදිරිවීර මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරන තුරු, හම්බන්තොට පාලන දිස්ත්‍රික්කයේ කටුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරී වශයෙන්.

ශ්‍රී ලංකා පරිපලාන සේවයේ III වැනි පන්තියේ, වී. රණතුංග මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරන තුරු, රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළය ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එස්. දෙමටපිටිය මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරන තුරු, කුරුණෑගල පාලන දිස්ත්‍රික්කයේ පිදිගම ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, එම්. කේ. එම්. ජේ. ජී. එම්. ජයසිරි මහත්මිය 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහකාර කොමසාරිස් වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජී. සේරසිංහ මහතා 1973. 10. 01 දින සිට නැවත නියමයක් කරනතුරු, පරිවාස හා ළමාරක්ෂක සේවා සහකාර කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, සී. එස්. ගුණරත්න මෙනෙවිය 1973. 10. 08 දින සිට නැවත නියමයක් කරනතුරු, ජාතික නිවාස සහකාර කොමසාරිස් වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වැනි පන්තියේ, ජේ. ඇම්. ඩී. ඇන්ඩෘ ජයමාන්න මහතා 1973. 10. 12 දින සිට නැවත නියමයක් කරනතුරු, රත්නපුර පාලන දිස්ත්‍රික්කයේ නිවිතිගල ප්‍රාදේශීය ආදායම් නිලධාරි වශයෙන්.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 09 දින,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය, කොළඹ 7.

12–373—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### 1973 අංක 577

අංකය : 2/1/43.

කෘෂිකර්ම හා ඉඩම් ඇමතිතුමා විසින් සහකාර සර්වේ ජනරාල් එස්. ජේ. මුණසිංහ මහතා, 1973 අගෝස්තු 17 වැනි දින සිට නියෝජ්‍ය සර්වේ ජනරාල් ලෙස පත්කර තිබේ.

ඒ. ටී. එම්. සිල්වා,
කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්.

1973 නොවැම්බර් මස 30 වෙනි දින,
කොළඹ 2, කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ දී ය.

12–329—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ නිවේදන

### 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනත

#### 7අ වගන්තිය යටතේ දැන්වීම

1972 අංක 17 දරණ දේශීය ආදායම් (සංශෝධන) සංශෝධිත පරිදි වූ 1963 අංක 4 දරණ දේශීය ආදායම් පනතේ 7අ වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ඇමති නානායක්කාර පතිරගේ මාටින් පෙරේරා වන මම, ග්ලෝබල් fිල්ම්ස් (සිලෝන්) ලිමිටඩ් විසින් පවත්වාගෙන යනු ලබන හා මෙහි උපලේඛනයෙහි විස්තර කෙරෙන ව්‍යාපාරය එකී වගන්තියේ කාර්ය සඳහා අනුමත ව්‍යාපාරයක් බවට මෙම දැන්වීම මගින් ප්‍රකාශ කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 නොවැම්බර් 29 දා,
කොළඹ දීය.

#### උපලේඛනය

සීගිරි පුවත පසුබිම් කරගෙන " ද ගෝඩ් කින්ග් " නමින් චිත්‍රපටියක් නිපදවීම සඳහා වූ ව්‍යාපාරය.

12–353—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### පඩිපාලක සභා ආඥාපනත

#### නිවේදනයයි

මීනිරන් කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ සාමාජිකයන්ව සිටි ඇස්. ඇල්. ඇම්. ඊබ්‍රාහිම් සහ පී. බී. ඒකනායක යන මහතුන් වෙනුවට එම පඩිපාලක සභාවේ නම නියමකොට පත් කළ සාමාජිකයින් ලෙස පෙනී සිටීමට පඩිපාලක සභා ආඥාපනතේ (136 වැනි අධිකාරය) 9 වන වගන්තිය යටතේ කම්කරු ඇමතිතුමන් විසින් ආචාර්ය කමල් කරුණානායක සහ මහාචාර්ය ඒ. ඩී. වී. ද එස්. ඉන්ද්‍රරත්න යන මහතුන් පත් කරන ලද බව වර්ෂ 1971 පඩිපාලක සභා ව්‍යවස්ථා සංග්‍රහයේ 30 වන ව්‍යවස්ථාව යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඇ. එ. ගෝගලී මොරගොඩ,
කම්කරු අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 03 වැනි දින,
කොළඹ දී ය.

12–546—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### මෝටර් වාහන පනත

(203 වැනි අධිකාරය වන) මෝටර් වාහන පනතේ 155 (3) සහ 237 වැනි වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන ඇමතිවරයා විසින් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාව තුල වූ ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දී ය.

#### නියෝගය

" නිශ්ශබ්දවන්න " යනුවෙන් පැහැදිලිව පින්තාරු කරන ලද නිවේදන වලින් දෙකෙළවර පෙන්නුම් කොට, කොළඹ නාගරික කොමසාරිස් වරයාගේ අණ පරිදි ප්‍රදර්ශනය කර ඇති, පිළිවෙලින් බෞද්ධාලෝක මාවත, පිඩ් මාවත හා සන්ධි වන ස්ථානයේ සිට නැගෙනහිර දෙසට අඩි 675 ක් ද, එම පාර ස්ටැන්මෝර් චන්ද්‍ර වංකය හා සන්ධි වන ස්ථානයේ සිට බටහිර දෙසට අඩි 515 ක් ද යනුවෙන් වූ ලක්ෂ්‍ය දෙක අතර, පිහිටි බෞද්ධාලෝක මාවත නමින් හැඳින්වෙන මහා මාර්ග කොටසෙහි යම් මෝටර් රථ වාහනයක සවි කර ඇත්තාවූ හෝ මෝටර් රථ වාහනයක රැගෙන යන්නා වූ හෝ යම් අනතුරු හඟවන උපකරණයක් දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ මොනයම් වේලාවකවත් කිසිම පුද්ගලයකු විසින් නාද නොකල යුතුය.

12–404—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ 143 සහ 237 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන අමාත්‍යවරයා විසින් ගාල්ල මහනගර සභාවේ පරිපාලන සීමාව තුල වූ ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝග.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1965 දෙසැම්බර් මස 5 වැනි දින අංක 14,576 දරණ ගැසට් පත්‍රයේ පළකරනු ලැබූ නියෝගවල, එහි වූ පලමුවන තීරුවේ 2 වන හා 3 කොටස් පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

(අ) බණ්ඩාරනායක මාවතේ, එය මාතර පාරට යාවන සන්ධියත් අබ්දුල් වහාබ් මාවතට යාවන සන්ධියත් අතර කොටස දෙපැත්තට වාහන ගමන් කරවීම.

(ආ) මාතර පාරේ, එය ඕල්කට් මාවතට යාවන සන්ධියත්, අබ්දුල් වහාබ් මාවතට යාවන සන්ධියත් අතර කොටස සහ මහ විදියත්. ඉරුදිනවල සහ සතියේ සියලුම දිනවල පස්වරු 7 සිට පසුදා පෙරවරු 6 දක්වාත් දෙපැත්තට වාහන හැසිරවීම සඳහා විවෘතව තැබීම.

(ඇ) අබ්දුල් වහාබ් මාවතේ, එය ඕල්කට් මාවත හා යාවන සන්ධියේ සිට බණ්ඩාරනායක මාවත දක්වා වූ කොටස ඉරු දිනවල හා ප්‍රසිද්ධ නිවාඩු දිනවල දෙපැත්තට වාහන ගමන් කරවීම සඳහා විවෘතව තැබීම.

12–403—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### මෝටර් වාහන පනත

(203 වැනි අධිකාරය වන) මෝටර් වාහන පනතේ 155 (3) සහ 237 වැනි වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන ඇමති වරයා විසින් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාව තුළ වූ ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන ඇමති.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

"නිශ්ශබ්දවන්න" යනුවෙන් පැහැදිලිව පින්තාරු කරන ලද නිවේදන වලින් දෙකලවර පෙන්නුම් කොට, කොළඹ නාගරික කොමසාරිස්වරයාගේ අණ පරිදි ප්‍රදර්ශනය කර ඇති, පිළිවෙලින් ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත හා ඩීන්ස් පාර මුණ ගැසෙන මංසන්ධියේ සිට නැගෙනහිර දිශාවට අඩි 40 ක් ද, එම මාවත හා මරදාන පාර මුණ ගැසෙන මංසන්ධියේ සිට බටහිර දිශාවට අඩි 56 ක් ද, යනුවෙන් වූ ලක්ෂ්‍ය දෙක අතර, පිහිටි ඊ. ඩබ්ලිව්. පෙරේරා මාවත නමින් හැඳින්වෙන මහා මාර්ග කොටසෙහි දී යම් මෝටර් රථයකට සවිකර ඇත්තා වූ හෝ මෝටර් රථ වාහනයක රැගෙන යන්නා වූ හෝ යම් අනතුරු හඟවන උපකරණයක් දිවා කාලය තුළ හෝ රාත්‍රී කාලය තුළ මොනයම් වේලාවකවත් කිසිම පුද්ගලයකු විසින් නාද නොකල යුතුයි.

12–402—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

එල්ඩී—බී. 29/53.

යොමු අංකය : ඇම්ඊ/2/ආර්2/398/70.

### මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 155(3) සහ 237 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාවලට ඇතුලත් ප්‍රදේශ සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගයයි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ අමාත්‍ය.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දීය.

නියෝගය

"නිශ්ශබ්දවන්න" යන වචන පැහැදිලිව පින්තාරු කොට කොළඹ නාගරික කොමසාරිස් වරයාගේ නියමය පරිදි ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් වලින් පෙන්වා ඇත්තාවූ ද, ගාලු පාර පිළිවෙළින් ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන පාර සමග සන්ධිවන ස්ථානයේ සිට අඩි 39 ක් උතුරු දෙසින් හා ශාන්ත ලෝරන්ස් පාර සමග සන්ධිවන ස්ථානයේ සිට අඩි 143 ක් දකුණු දෙසින් පිහිටියාවූ ද, පර්යන්ත ලක්ෂ්‍ය දෙක අතර වූ ගාලු පාර යනුවෙන් හඳුන්වනු ලබන මහා මාර්ග කොටසේ දී කිසිම තැනැත්තකු විසින් යම් මෝටර් වාහනයකට සවිකර තිබෙන හෝ මෝටර් වාහනයක් තුළ ගෙන යන යම් අනතුරු හඟවන උපකරණයක් දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ කිසිම වේලාවක නාද නොකළ යුතුය.

12–401—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### මෝටර් වාහන පනත

එල්ඩී—බී. 61/52.

(203 වැනි අධිකාරය වන) මෝටර් වාහන පනතේ 143(1) සහ 237 වැනි වගන්තිවලින් තමා වෙත පැවැරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන ඇමතිවරයා විසින්, කොළඹ මහනගර සභාවේ පාලන සීමාව තුළ වූ ප්‍රදේශය සඳහා සාදනු ලැබ, ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ නියෝගය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහණ අමාත්‍ය.

1973 නොවැම්බර් මස 21 වැනි දින,
කොළඹ දීය.

නියෝගය

මෙහි දැක්වෙන උපලේඛනයෙහි I වැනි තීරයේ සඳහන් මහා මාර්ග කොටස්වල පාවිච්චි කරන සෑම මෝටර් වාහනයක්ම එම උපලේඛනයෙහි ඊට ඉදිරියෙන් වූ II වැනි තීරයේ දක්වා ඇති දිශාවට ධාවනය කළයුතු වන අතර, එම කොටස්වල නැවැත්වූ විට එම දිශාවට පමණක් මුහුණලා සිටින්නට නතරකර තැබිය යුතුයි.

උපලේඛනය

| I<br>මහා මාර්ග කොටස | II<br>දිශාව |
|---|---|
| (1) ශ්‍රී කදිරේසන් වීදිය—ශ්‍රී කදිරේසන් වීදිය, ආඹිවාල් වීදිය සමග සම්බන්ධ වන්නාවූ සහ ආඹිවාල් වීදියේ අංක 8 දරණ ස්ථානයට යාවන්නාවූ මංසන්ධියද, ශ්‍රී කදිරේසන් වීදිය කයිමන් දොරකඩ සමග සම්බන්ධ වන්නාවූ සහ ආදුරුප්පු වීදියේ අංක 3 ඒ දරන සථානය හා කයිමන් දොරකඩ, හෙට්ටි වීදියේ අංක 34/5 දරන ස්ථානයට යාවන්නාවූ මංසන්ධියද, අතර වූ ශ්‍රී කදිරේසන් වීදියේ කොටස | කයිමන් දොරකඩ දිශාවට. |
| (2) ඒ. ජී. හින්නි අප්පුහාමි මාවත (වැන් රුයන් විදිය) විවේකානන්ද කන්ද සමග සම්බන්ධ වන්නාවූ සහ විවේකානන්ද කන්දේ අංක 34 සහ 46 දරන ස්ථානවලට යාවන්නාවූ මංසන්ධියද, ඒ. ජී. හින්නි අප්පුහාමි මාවත (වැන් රුයන් වීදිය) අලුත් හෙට්ටි වීදිය සමග සම්බන්ධ වන්නාවූ සහ අලුත් හෙට්ටි වීදියේ අංක 67 සහ 73 දරන ස්ථානවලට යාවන්නාවූ මංසන්ධියද අතර වූ ඒ. ජී. හින්නි අප්පුහාමි මාවතේ (වැන් රුයන් වීදියේ) කොටස. | අලුත් හෙට්ටි වීදිය දිශාවට |
| (3) පෙනික්වික් පාර—පෙනික්වික් පාර, ගාලුපාර සමග සම්බන්ධ වන්නා වූ මංසන්ධියද පෙනික්වික් පාර 37 වැනි පටුමග සමග සම්බන්ධ වන්නාවූ මංසන්ධියද අතර වූ පෙනික්වික් පාරේ කොටස. | 37 වැනි පටුමග දිශාවට |

12–400—72.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

### මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ, 155(3) සහ 237 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමා වලට ඇතුළත් ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගයයි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන අමාත්‍යවරයා.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දීය.

### නියෝගය

"නිශ්ශබ්ද වන්න" යන වචන පැහැදිලිව පින්තාරු කොට කොළඹ නාගරික කොමසාරිස්වරයාගේ නියමය පරිදි ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම් වලින් පෙන්වා ඇත්තා වූ ද, ශ්‍රී කදිරේසන් වීදිය පිළිවෙලින් ආඩිවාල් වීදිය සමග සන්ධිවන ස්ථානයේ සිට අඩි හැත්තෑ පහක් දකුණු දෙසින් හා කයිමන් දොරකඩ සමග සන්ධි වන ස්ථානයේ සිට අඩි හැත්තෑ පහක් උතුරු දෙසින් පිහිටියා වූ ද, පර්යන්ත ලක්ෂ්‍ය දෙක අතර වූ ශ්‍රී කදිරේසන් වීදිය යනුවෙන් හඳුන්වනු ලබන මහා මාර්ග කොටසේ දී කිසිම තැනැත්තකු විසින් යම් මෝටර් වාහනයකට සවිකර තිබෙන හෝ මෝටර් වාහනයක් තුළ ගෙන යන යම් අනතුරු හඟවන උපකරණයක් දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ කිසිම වේලාවක නාද නොකළ යුතුය.

12–399—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඇම්ර්/2/ආර් 2/23/71.

### මෝටර් වාහන පනත

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 155(3) සහ 237 වන වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ප්‍රවාහන අමාත්‍යවරයා විසින් කොළඹ මහ නගර සභාවේ පරිපාලන සීමාවලට ඇතුළත් ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරන ලද නියෝගයයි.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන අමාත්‍යවරයා.

1973 නොවැම්බර් 21 වැනි දින,
කොළඹ දීය.

### නියෝගය

"නිශ්ශබ්ද වන්න" යන වචන පැහැදිලිව පින්තාරු කොට කොළඹ නාගරික කොමසාරිස්වරයාගේ නියමය පරිදි ප්‍රදර්ශනය කර තිබෙන දැන්වීම්වලින් පෙන්වා ඇත්තා වූ ද, විජේරාම මාවත පිළිවෙලින් බෞද්ධාලෝක මාවත සමග සන්ධිවන ස්ථානයේ සිට අඩි 1,050 ක් . උතුරු දෙසින් හා ග්‍රෙගරි පාර සමග සන්ධිවන ස්ථානයේ සිට අඩි 60ක් දකුණු දෙසින් පිහිටියා වූ ද, පර්යන්ත ලක්ෂ්‍ය දෙක අතර වූ විජේරාම මාවත යනුවෙන් හඳුන්වනු ලබන මහා මාර්ග කොටසේ දී කිසිම තැනැත්තකු විසින් යම් මෝටර් වාහනයකට සවිකර තිබෙන හෝ මෝටර් වාහනයක් තුළ ගෙන යන යම් අනතුරු හඟවන උපකරණයක් දිවා කාලයේ හෝ රාත්‍රි කාලයේ කිසිම වේලාවක නාද නොකළ යුතුය.

12–398—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

එල්.ඩී—බී. 24/51.

### මෝටර් වාහන පනත

(203 වන අධිකාරයවූ) මෝටර් වාහන පනතේ 143 (1) සහ 237 වන වගන්තිවලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන අමාත්‍යවරයා විසින් පානදුරය නගර සභාවේ පරිපාලන සීමාව තුළ වූ ප්‍රදේශය සඳහා සාදනු ලැබ ජාතික රාජ්‍ය සභාව විසින් අනුමත කරනු ලැබූ නියෝගය.

ලෙස්ලි ගුණවර්ධන,
ප්‍රවාහන අමාත්‍ය.

1973 නොවැම්බර් 21 වන දින,
කොළඹ දීය.

### නියෝගය

1972 ඔක්තෝබර් 27 වන දින අංක 31 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, එහි 1 වන නියෝගයෙහි පහත සඳහන් අයුරු මෙසින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "පෙ. ව. 7 සහ ප. ව. 7" යන යෙදුම වෙනුවට "පෙ. ව. 7 සහ ප. ව. 6" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) එහි (අ) ඡේදයෙහි "ජනප්‍රිය මාවත" යන වචන වෙනුවට "දොස්තර සයිමන් ගුණවර්ධන මාවත" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) එහි (උ) ඡේදය අවසානයේදී "අඟහරුවාදා, බ්‍රහස්පතින්දා සහ සෙනසුරාදා යන දිනයන්හි පාරේ කොළඹ පැත්තෙන් ද, සඳුදා, බදාදා සහ සිකුරාදා යන දිනයන්හි පාරේ ගාල්ල පැත්තෙන් ද," යන වචන අන්තර්ගත කිරීමෙන්.

12–405—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### සමගි මණ්ඩල පනත

#### ආඥාව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබූ 1972 ජූනි මස 12 වැනි දින අංක 11/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1973 ජූනි මස 29 වැනි දින අංක 66 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 15 දරන ස්ථානයෙහි විස්තර කරනු ලැබූ බදුල්ල දිස්ත්‍රික්කය තුල පිහිටි ඇටම්පිටිය ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමතිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන්. පහත සඳහන් තැනැත්තන් මෙසින් පත් කරමි :—

(1) ඇටම්පිටිය, 'මිහිර' හි පදිංචි යකුපිටියගේ ජයසිංහ මහතා.

(2) පට්ටියගෙදර, ඇත්තලගෙදර, 'ශ්‍රියාසේවන' හි පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ සුදුබණ්ඩා මහතා.

(3) පට්ටියගෙදර, වරකාදන්ඩ, ගස්ගොල්ල. 'වනසිසිල' හි පදිංචි අබේසිංහ මුදියන්සේලාගේ කිරිබණ්ඩා අබේසිංහ මහතා.

(4) පට්ටියගෙදර, දෙහිවින්න, උලුගෙදර පදිංචි ආරච්චි මුදියන්සේලාගේ හීන්බණ්ඩා මහතා.

(5) පට්ටියගෙදර, නෙලුව පදිංචි පරණ ලියනගේ සයිමන් සිංඤෝ මහතා.

(6) පට්ටියගෙදර, ඇල්ලේවෙල, උඩුගල ගෙදර පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ ජයසේකර මහතා.

(7) පට්ටියගෙදර, කුඩුම්භුවෙල පදිංචි අගලකුඹුරේ මුදියන්සේලාගේ උපාලි ජයසුමණ මහතා.

(8) පට්ටියගෙදර. පෙරහෙට්ටිය, බෝගහපතනේ ගෙදර පදිංචි බෝගහපතනේ සච්කෙන්ද මුදියන්සේලාගේ සෝමපාල කරුණාරත්න මහතා

(9) හාලිඇල, මොරේතොට හේල්ලන්ද පදිංචි හේවානායක මුදියන්සේලාගේ සුදුබණ්ඩා හේවානායක මහතා.

(10) ඇටම්පිටිය, බ/දෙසිවින්න විදුහලේනි මූහන්දිරම්ලාගේ අප්පුහාමි මහතා.

(11) ඇටම්පිටිය. දෙහිවින්න අලවත්තේ ගෙදර පදිංචි කාන්ගන මුදියන්සේලාගේ රත්නායක මහතා.

(12) ඇටම්පිටිය, අමුනෝ අරාව පදිංචි විජේතුංග බේවින් සොයිසා මහතා.

(13) ඇටම්පිටිය, අඹේවෙල පදිංචි වීරතුංග මුදියන්සේලාගේ ජයසේකර මහතා.

(14) පට්ටියගෙදර, නෙලුව වරල්වත්ත පදිංචි රත්නායක මුදියන්සේලාගේ මුතුබණ්ඩා මහතා.

(15) ඇටම්පිටිය, අම්පිටිගොඩ පදිංචි උඩුකුඹුරගේ ප්‍රැන්සිස් ද සිල්වා මහතා.

(16) පච්චියගෙදර, කටුගහ, කහටගහ හංදිය පදිංචි දිසානායක මුදියන්සේලාගේ සුදුබණ්ඩා දිසානායක මහතා.

(17) පච්චිගෙදර, පෙරහෙට්ටිය, "නෙල්පඩි වත්ත' හි පදිංචි සොයමාන් මරුවෝ මහතා.

(ආ) ඇටම්පිටිය, 'මිහිර' හි පදිංචි යකුපිටියගේ ජයසිංහ මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–523/1—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**සමගි මණ්ඩල පනත**

ආඥව

ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 95 වැනි වගන්තියේ (2) වැනි උප වගන්තිය යටතේ පනවනු ලැබ 1972 ජූනි මස 10 වැනි දින අංක 11/2 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නිවේදනය සමග කිය විය යුතු 1963 අංක 12 දරන පනතින් සංශෝධිත 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතේ 3(1), 3(8) හා 4(1) වන වගන්තිවලින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නියෝජ්‍ය අධිකරණ ඇමති රත්නසිරි වික්‍රමනායක වන මම—

(අ) 1973 මැයි මස 25 වැනි දින අංක 61 දරන ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලැබූ 1958 අංක 10 දරන සමගි මණ්ඩල පනතෙහි 3(2) වන වගන්තිය යටතෙහි වූ දැන්වීමේ උප ලේඛනයෙහි අංක 14 දරන සභාවයෙහි විස්තර කරනු ලැබූ නුවරඑළිය දිස්ත්‍රික්කය තුල පිහිටි උඩපළාත ගම් ප්‍රදේශය සඳහා පිහිටුවනු ලැබූ සමගිදායකයින්ගේ සභාවේ සාමාජිකයන් වශයෙන් පහත සඳහන් තැනැත්තන් මෙයින් පත් කරමි :—

(1) රූපහ විද්‍යාවිලාස පිරිවෙනෙහි පූජ්‍ය ගරු පණ්ඩිත සද්ධානන්ද වලපනේ සංඝ නායක ස්වාමීන් වහන්සේ.

(2) හල්ග්‍රන්ඔය, මන්ත්‍රීතැන්න ශ්‍රී විවේකාරාමයේ පූජ්‍ය ගරු පණ්ඩිත වැවේගම සාසනසිරි ස්වාමීන් වහන්සේ.

(3) කුරුපණාවෙල සුනන්දාරාමයේ පූජ්‍ය වැතලාවේ අරිය වංශ ස්වාමීන් වහන්සේ.

(4) කුරුපණාවෙල පදිංචි හේරත් මුදියන්සේලාගේ ගුණතිලක මහතා.

(5) රූපහ, පින්නපිටියෙගෙදර පදිංචි වීරසේකර මුදියන්සේලාගේ පුංචි බණ්ඩා මහතා.

(6) රූපහ පිරිවෙනෙහි කළුබණ්ඩා රත්නායක මහතා.

(7) රූපහ, ඇඹිලන්පහඅඹළියද්ද පදිංචි අළුත්ගෙදර එන්දෝරිස් මහතා.

(8) රූපහ, අඹළියද්ද පදිංචි හේරත් මුදියන්සේලාගේ සෝමවතී මහත්මිය.

(9) උඩපුස්සැල්ලාව, ගල්කඩපතාන පදිංචි මහරණවකගේ පොඩිහාමිනේ මහත්මිය.

(10) කුරුපණාවෙල, ගලතැන්න පදිංචි හේරත් මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා.

(11) කුරුපණාවෙල, වතුලන්ද පදිංචි වරුෂහැන්නැදිගේ ජෝන් සොයිසා මහතා.

(12) උඩපුස්සල්ලාව, 'ශාන්ත මාග්‍රට්' හි පදිංචි මාතර ආචාරිගේ සුමනපාළ මහතා.

(13) හල්ග්‍රන්ඔය, රත්නායකපුර පදිංචි බෝගහවත්තේ සමරසේකර මුදියන්සේලාගේ ධර්මදාස මහතා.

(14) කුරුපණාවෙල, වටගොඩ නෙදර පදිංචි වතුලන්දේ ගෙදර රත්නායක මුදියාන්සේලාගේ පියදාස මහතා.

(15) රූපහ, හඳුගස්තැන්න පදිංචි විජේකෝන් මුදියන්සේලාගේ පියසේන මහතා.

(16) කුරුපණාවෙල, මීපනාව 'ශාන්ති' හි පදිංචි විජේකෝන් මුදියාන්සේලාගේ මඩුගස්තැන්න පුංචිබණ්ඩා මහතා.

(17) රූපහ, අඹළියද්ද පදිංචි ගාල්ලේ පතිරණගේ සුනිල් කුමාරදාස මහතා.

(18) හල්ග්‍රන්ඔය, රාගල වී. සී. කාර්යාලයෙහි ලයනල් රණසිංහ මහතා.

(19) උඩපුස්සැල්ලාව, ගල්කඩපතාන පදිංචි කොඩිතුවක්කු ගලහේනගේ ගාමිණී ධර්මසේන මහතා.

(20) කුරුපණාවෙල, පන්සලේ ගෙදර පදිංචි පන්සලේ ගෙදර හේරත් මුදියන්සේලාගේ පුංචිබණ්ඩා මහතා.

(21) කුරුපණාවෙල, මීපනාව 'වෙද නිවස' යි පදිංචි දිඹුල් පිටියේ ගෙදර විජේකෝන් මුදියාන්සේලාගේ ආරියරත්න මහතා.

(22) රූපහ, කොටබේ, පාළුගම පදිංචි වීරසිංහ මුදියාන්සේලාගේ විජේරත්න මහතා.

(23) රූපහ, පහළගම පදිංචි රත්නායක මුදියාන්සේලාගේ හීන් අප්පුහාමි මහතා.

(ආ) කුරුපණාවෙල පදිංචි හේරත් මුදියන්සේලාගේ ගුණතිලක මහතා ඉහත කී සභාවෙහි සභාපති වශයෙන් මෙයින් පත් කරමි.

(ඇ) ඉහත කී සභාවේ සාමාජිකයෙකු වශයෙන් ඒ එක් එක් තැනැත්තකු පත් කරනු ලබන කාලය මේ ආඥව ගැසට් පත්‍රයෙහි ප්‍රසිද්ධ කරනු ලබන දිනයේ සිට අවුරුදු තුනක් විය යුතු බව ද මෙයින් නිශ්චය කරමි.

රත්නසිරි වික්‍රමනායක,
නියෝජ්‍ය අධිකරණ ඇමති.

1973 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ, අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

12–523/2—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

අංක : සී/අයි. 1011.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනත**

4 (1) වන වගන්තිය යටතේ නියෝගයයි

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් වරයාගේ ප්‍රකාශනයේ නියමිතකර දක්වා ඇති කාරණය පිළිබඳව එක් පාර්ශවයක් වශයෙන්, ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමය, 213, ධර්මපාල මාවත, කොළඹ 7 සහ අනික් පාර්ශවය වශයෙන්, චූයි වැන් පිං මහතා, 98, චැතැම් වීදිය, කොළඹ 1, මිල්ලන්ගේ ගෙදර මානෙල් මිය, 29-31, සීමන්ස් පාර, කොළඹ 10 සහ, සී. එච්. ඇම්. සිංගිරි මැනිකේ, 44, යූනියන් ලේන්, කොළඹ 2, අයිතිකරුවන් පීකිං හෝටලය, 255, ධර්මපාල මාවත, කොළඹ 7. අතර කාර්මික ආරවුලක් පවතින හෙයින් ද,

කම්කරු ඇමති තැන්පත් මයිකල් පෝල් ද සොයිසා සිරිවර්ධන වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරණ කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ පාගොඩ පාරේ අංක 18හි පදිංචි ජේ. ජී. එල්. ස්වාරිස් මහතා වෙත මෙයින් යොමුකරනු ලැබේ.

එම්. පී. ද සොයිසා සිරිවර්ධන,
කම්කරු ඇමති.

1973 නොවැම්බර් මස 22 දින,
කොළඹදීය.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) 131 වන අධිකාරිය—කාර්මික ආරවුල් පනත**

එක් පාර්ශවයක් වශයෙන්, ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමය, 213, ධර්මපාල මාවත, කොළඹ 7 සහ අනෙක් පාර්ශවය වශයෙන් චූයි වැන් පිං මහතා, 98, චැතැම් වීදිය, කොළඹ 1, මිල්ලන්ගේ ගෙදර මානෙල් මිය, 29-31, සීමන්ස් පාර, කොළඹ 10 සහ සී. එච්. ඇම්. සිංගිරි මැනිකේ මිය, 44, යූනියන් ලේන්, කොළඹ 2, අයිතිකරුවන් පීකිං හෝටලය, 255, ධර්මපාල මාවත, කොළඹ 7.
අතර පවතින කාර්මික ආරවුලක් පිළිබඳවයි.

### ආරවුලට හේතුවී පවත්නා කාරණය පිළිබඳ ප්‍රකාශය

ඉහත සඳහන් පාර්ශවයන් අතර ආරවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ පීකිං හෝටලය වසා දැමීමෙන් පසුව එම හෝටලයේ අයිතිකරුවන් වූ චුයි චැන් පිං මහතා සහ ඇම්. ජී. මානෙල්, ඩී. එච්. ඇම්. ඩිංගිරි මැනිකා යන මහත්මීන් විසින් කොළඹ 7, ධර්මපාල මාවතේ අංක. 255 හේ පීකිං හෝටලයේ සේවයේ යොදවා සිටි ශ්‍රී ලංකා නිදහස් වෙළඳ හා කාර්මික ආයතන සේවක සංගමයේ පහත සඳහන් සාමාජිකයන් සේවයෙන් පහකිරීම යුක්ති සහගතද යන්නත් ඔවුන් එකිනෙකාට කුමන සහනයක් හිමිද යන්නත් පිළිබඳව වේ.

(1) ටී. ජී. චන්ද්‍රපාල, (2) සී. රිචඩ්, (3) එම්. ජී. ධර්මසේන, (4) ජී. ඩී. විල්බට්, (5) ඩබ්. සී. ගුනපාල, (6) කේ. පී. ඇඩ්මිරල්, (7) ධර්මදාස දහනායක, (8) එච්. ටී. සෝමතිලක, (9) වයි. එස්. සිංගරායර්, (10) ඒ. ජී. විලියම් සිරි, (11) එච්. ඩබ්. ප්‍රේමදාස, (12) කේ. පියදාස, (13) ඩිත්සන් සමරරත්න, (14) ජී. කේ. විමල තුන්ග, (15) අබ්දුල් කරීම්, (16) ආර්. ඒ රූපසිංහ, (17) ඒ. පී. ගුන සිරි, (18) එස්. එච්. විජේදාස, (19) ජී. කේ. ඒඩින්, (20) ජිනදාස මාඉටිපේ, (21) එස්. එස්. ප්‍රනාන්දු.

1973 නොවැම්බර් මස 20 වැනිදා වූ මෙදින, කොළඹ, කම්කරු කොමසාරිස්ගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

ඩබ්ලිව්. එල්. පී. ද මැල්,
කම්කරු කොමසාරිස්.

12–308—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

### ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

කොග්ගල ධීවර ආරාවුල

යථෝක්ත ධීවර ආරවුල පිළිබඳව විභාගයක් පවත්වා වාර්තා කිරීමට ගරු ධීවර ඇමතිතුමා විසින් පත් කරනු ලැබූ ජේ. පී. එල්. ගුණවර්ධන මහතාගේ වාර්තාව මහජනයාගේ දැනගැනීම සඳහා ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය ප්‍රකාරව මෙසින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. මෙම ධීවර ආරාවුලින් හෝ එයට අදාල වූ හෝ සම්බන්ධ වූ හෝ එයින් පැනනගින්නා වූ හෝ කිසියම් කාරණයකින් හිරිහැර යට පත් හා මෙම වාර්තාවේ දක්වා ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ කරුණු සැලකර සිටීමට කැමති යම් අයෙකු වේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන දිනයේ සිට මාසයක් ඉකුත් වීමට පෙර ධීවර ඇමතිතුමා වෙත ලියවිල්ලකින් එම කරුණු ඉදිරිපත් කළ යුතුය.

ඊ. ජී. ගුණවර්ධන,
ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 04 දින,
කොළඹ දී ය.

### කොග්ගල ධීවර ආරාවුල—වාර්තාව

වැලිගම ධීවර කාර්යාලය,
1973 අගෝස්තු 18 දින දී ය.

ප්‍රසිද්ධ විභාගයක් පවත්වා වාර්තා කිරීම සඳහා ධීවර ඇමතිතුමා විසින් ධීවර ආඥාපණතේ 20 (I) වැනි වගන්තිය ප්‍රකාරව මෙම ආරාවුල මා වෙත යොමු කර ඇත.

මෙම ආරාවුලට සම්බන්ධ පක්ෂ දෙකක් වේ. එක් පක්ෂයක් කොග්ගල ගමෙහි ස්ථිර පදිංචිකරුවෝ වෙති. (මේ පක්ෂය, පළමු වැනි පක්ෂය යනුවෙන් හඳුන්වනු ලැබේ.) ඔවුන් හා ඔවුන්ගේ මුතුන් මිත්තන් ද පරම්පරා ගණනක සිටම මේ තොටුපළවල මසුන් ඇල්ලීම කර ඇත. ආරාවුලට සම්බන්ධ අනෙක් පක්ෂය ද (මේ පක්ෂය, දෙවැනි පක්ෂය යනුවෙන් හඳුන්වනු ලැබේ.) දැනට එකී කොග්ගල ගමෙහි පදිංචිකරුවෝ වෙති. ඔවුන් කොග්ගලට පැමිණ ඇත්තේ 1950 මුල් භාගයේ දී ය. මේ අය මෙන්ම පළමුවැනි පක්ෂයට අයත් පිරිස ද ඔවුන්ට රජයෙන් දී ඇති ඉඩම් කට්ටිවලින් සැදුම් ලත් ජනපදයක පදිංචිව සිටිති. දෙවැනි පක්ෂයට අයත් ධීවරයෝ ද, ඔවුන්ගේ ප්‍රධාන ජීවිකා වෘත්තිය වශයෙන් මසුන් ඇල්ලීමේ කර්මාන්තයෙහි යෙදී සිටිති.

පළමුවැනි පක්ෂයට අයත් ධීවරයින් ඔවුන්ගේම ඉඩම් කට්ටිවල පදිංචිව සිටි අතර පසුගිය යුද්ධ කාලයේ දී එම ඉඩම් රජයට පවරා ගන්නා ලදී. මේ අත්කර ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුනට තම ගේ දොර හැර දමා පදිංචිය සඳහා වෙනත් ප්‍රදේශවලට යාමට සිදුවිය. කෙසේ වුවත්, යුද්ධය අවසන් වීමෙන් පසුව හා 1950 මුල් භාගයේ දී ඔවුන්ගේ ඉඩකඩම් යළිත් ලබා දෙන ලද අතර ඒ අනුව ඔවුහු නැවතත් කොග්ගල පදිංචිකරුවන් වූහ. කතළුව නමැති වෙනත් ගමක ඒ දක්වා විසූ දෙවැනි පක්ෂයේ අයට ද ඉඩම් කට්ටි ලැබුණි. ඉන් පසුව හා දැනට ද මේ දෙපක්ෂයම කොග්ගල ගමේ එකම ජනපදයක පදිංචිව සිටින අතර ඔවුන්ගේ ජීවිකා වෘත්තීය වශයෙන් දෙකොට්ඨාශයටම මසුන් ඇල්ලීමෙහි යෙදීමට සිදුව ඇත.

විසදිය යුතු කරුණු වලට අනුව, මසුන් අල්ලන තොටුපළවල් 4 ක් ඇත. ඒවා නම් වශයෙන් මෙසේය:—

(1) මෝදරහිල්ල තොටුපල.

(2) මරදවල තොටුපල.

(3) අන්දන තොටුපල.

අන්දන තොටුපලේ මසුන් ඇල්ලීම සඳහා අයිතිවාසිකම් ඉල්ලා නොසිටින බව පළමුවැනි පක්ෂය කියා සිටි අතර විභාගයේ දී මේ පක්ෂ දෙකම ඔවුන්ගේ අයිතිවාසිකම් ඉහත සඳහන් කළ මෝදර හිල්ල හා මරදවල යන තොටුපලවල් දෙකට පමණක් සීමා කළහ.

දීර්ඝ කාලයක සිටම මේ ආරවුල පිළිබඳව පැමිණිලි හා ප්‍රති විරුද්ධ පැමිණිලි කර තිබී ඇති අතර මේ නිසා ධීවර දෙපාර්තමේන්තු වේ හා වෙනත් නිලධාරීන් මැදහත් වී කටයුතු කිරීම අවශ්‍ය විය. මේ අතරතුරදී ගාල්ල දිස්ත්‍රික්කයේ දිසාපති විසින් ආරවුල බේරුම් කිරීම සඳහා තාවකාලික වැඩ පිළිවෙලක් යෝජනා කරන්නට යෙදුන අතර එකී වැඩපිළිවෙලට එකඟවෙමින් දෙපක්ෂයම ඒ අනුව මසුන් ඇල්ලීමේ කටයුතුවල යෙදී සිට ඇත. එය සිදුවී ඇත්තේ 1969 වර්ෂයේ දී ය. එම වර්ෂයේ දී ම පළමුවැනි පක්ෂය විසින් මේ ආරාවුල පිළිබඳව ධීවර අධ්‍යක්ෂ වෙත කරුණු ඉදිරිපත් කරන ලද අතර, මේ දෙපක්ෂය අතර කාලයක් තිස්සේ පැවතෙන ආරාවුල බේරුම් කිරීමට ධීවර දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද ක්‍රියා මාර්ගවල ප්‍රතිඵලය වී ඇත්තේ මෙම විභාගයයි.

ඔවුන් අතර හටගෙන ඇති ආරාවුල සාමකාමී අන්දමින් බේරුම් කර ගැනිමට, ආරාවුලට සම්බන්ධ දෙපක්ෂය විභාගය ආරම්භයේ දී ම එකඟ වූහ. විභාගයේ දී දෙපක්ෂය අතර අවංකවූත් සම්පූර්ණ වූත් සාකච්ඡාවක් පවත්වන ලදී. මෙහිදී පළමුවැනි පක්ෂය පමණක් නීතිඥ රාජා අබේවික්‍රම මහතා විසින් නියෝජනය කරන ලදී. අනාගතයේ දී සිදුවිය හැකි ගැටුම් වලක්වන සුළු හා ඔවුන්ගේ අනාගත පැවැත්මට හිතකර වන්නා වූ විසඳීමකින් ඔවුන්ට සිදුවන ප්‍රයෝජනය ගැන දෙපක්ෂය විසින්ම වටහා ගැනීම ගැන මම සතුටු වෙමි. ආරාවුල විසඳීමේ කොන්දේසි කෙටුම්පත් කර ඇති අතර දෙවෙනි පක්ෂයේ නියෝජිතයින් විසින් එයට මා ඉදිරිපිට අත්සන් තබා ඇත. එසේ අත්සන් තබන ලද ආරාවුල විසඳීමේ කොන්දේසි 'එක්ස්' යනුවෙන් ලකුණු කර මේ වාර්තාවෙහි ගොනුකර ඇත.

ඉහත සඳහන් විසඳීම සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කිරීමෙන් ප්‍රදේශයේ ධීවර පරීක්ෂක කේ. දොන් මයිකල් මහතා විසින් ඒ මහතාගේ නොමසුරු සහයෝගය කොමිසමට දෙනු ලැබීය. ඔවුන් විසින් දෙන ලද අගනා සහාය පිළිබඳව රාජා අබේවික්‍රම මහතාටත් දොන් මයිකල් මහතාටත් මගේ ස්තුතිය ප්‍රසිද්ධියේම පළ කරනු කැමැත්තෙමි.

මගේ නිර්දේශයක් පහත දක්වමි :—

(1) අන්දන තොටුපල, මෙම විභාගයේ විෂය ප්‍රමාණයට අයත් නොවේ.

(2) මෙම විභාගය, (I) මෝදරහිල්ල තොටුපලට හා (II) මරදවල තොටුපලට පමණක් සීමාවේ.

(3) එකී තොටුපල දෙකෙහි දැනට පිහිටුවා ඇති කණ්ඩු දෙපක්‍ෂයම විසින් පාවිච්චි කළ යුතු අතර මසුන් ඇල්ලීම සඳහා දැනට අනුගමනය කරන ක්‍රියා පිළිවෙල දිගටම පැවතිය යුතුය.

(4) දැනට සිටුවා ඇති කණු ගණන උපරිම වශයෙන් 70 දක්වා වැඩි කිරීමට දෙපක්‍ෂයටම අයිතිය තිබේවේ.

(5) එසේ වැඩි කෙරෙන කණු ගණන පක්‍ෂ දෙක අතර සමානව බෙදා දිය යුතුය.

(6) ඉහත සඳහන් තොටුපලවල අතිරේක වශයෙන් කණු සිටුවීම කළ යුත්තේ ප්‍රදේශයේ ධීවර පරීක්‍ෂක තැනගේ නියෝග හා අනුමැතිය යටතේ සි. කණු සිටුවීම සම්බන්ධයෙන් තීරනය කිරීම මුළුමනින්ම ඔහුගේ අභිමතය පරිදි සිදුවනු ඇති අතර ඔහුගේ තීරණය දෙපක්‍ෂයටම බලපැවැත්වෙනු ඇත.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන,
කොමසාරිස්,
කොග්ගල ධීවර ආරාවුල.

ඉහත සඳහන් තීරණය කියවා සිංහලයට පරිවර්තනය කර පැමිණ සිටි පක්‍ෂවලට පැහැදිලි කර දෙන ලදී.

ඒ. ඩී. ජේ. ගුණවර්ධන,
කොමසාරිස්,
1973 අගෝස්තු 18 දින.

12–419—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය යටතේ කෙරෙන නිවේදනය**

කලමුල්ල ධීවර ආරවුල

යථෝක්ත ධීවර ආරවුල පිළිබඳව විභාගයක් පවත්වා වාර්තා කිරීමට ගරු ධීවර ඇමතිතුමා විසින් පත්කරනු ලැබූ ජේ. පී. එල්. ස්වාරිස් මහතාගේ වාර්තාව මහජනයාගේ දැනගැනීම සඳහා ධීවර ආඥාපණතේ (212 වැනි අධිකාරය) 20 (9) වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

2. මෙම ධීවර ආරවුලින් හෝ එයට අදාලවූ හෝ සම්බන්ධවූ හෝ එයින් පැන නගින්නාවූ හෝ කිසියම් කාරණයකින් හිරිහැරයට පත් හා මෙම වාර්තාවේ දක්වා ඇති කිසියම් කරුණක් සම්බන්ධයෙන් හෝ කරුණු සැලකර සිටීමට කැමති යම් අයෙකු වේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන දිනයේ සිට මාසයක් ඉකුත් වීමට පෙර ධීවර ඇමතිතුමා වෙත ලියවිල්ලකින් එම කරුණු ඉදිරිපත් කළ යුතුය.

ඊ. පී. ගුණවර්ධන,
ධීවර අමාත්‍යාංශයේ ලේකම්.

1973 දෙසැම්බර් මස 04 දින,
කොළඹ දීය.

**කලමුල්ල ධීවර ආරවුල පිළිබඳ විභාගයේ වාර්තාව**

මෙම ආරාවුල පිළිබඳ විභාගය, කළුතර ධීවර කාර්යාලයේදී පවත්වන්නට යෙදුනු අතර, දිගින් දිගටම විවාදයට භාජනය වීමෙන් අනතුරුව සාමකාමී විසඳුමකට එළඹීමෙන් එය අවසන් කෙරිණි.

කලුතර දිස්ත්‍රික්කයේ කළමුල්ල සහ කටුකුරුන්ද යන ගම් අතර පිහිටි මා දැල් වටකරනු ලබන මුහුදු ප්‍රදේශය, අයත්වන දේශික ජල තීරයෙහි මාදැල් වටකිරීම පිළිබඳ ඔවුනොවුන් සතු අයිතිවාසිකම් සම්බන්ධයෙන්, එක් අතකින් එම්. බෙනඩික් සිල්වා හා එම්. ඕ. පී. ගුණතිලක යන අය සහ ඔවුන් යටතේ සංවිධානය වූ තවත් මාදැල් ධීවරයින් කණ්ඩායමක් ද අනෙක් අතට කලුතර, කටුකුරුන්දේ එම්. ක්ලෙමන්ට් ඩයස් නමැති අය යටතේ සංවිධානය වූ තවත් මාදැල් ධීවරයන් කණ්ඩායමක්ද අතර කළමුල්ල හා කටුකුරුන්ද අතර හට ගෙන තිබූ ධීවර ආරවුලක් සම්බන්ධයෙන් 212 වැනි අධිකාරය වන ධීවර ආඥාපනතේ 20 වැනි වගන්තිය 3 වැනි උප වගන්තිය යටතේ මා වෙත කාර්ය නිර්දේශයක් නිකුත් කරන්නට යෙදුනි.

**එම කාර්ය නිර්දේශය පහත දැක්වේ :**

(i) බෙනඩික් සිල්වා මහතා සහ එම්. ඕ. පී. ගුණතිලක මහතා යටතේ සංවිධානය වී සිටින මාදැල් ධීවරයින් කණ්ඩායම් දේශික ජල තීරයේ යටකී ප්‍රදේශය තුළ මසුන් ඇල්ලීමේ පාරම්පරික අයිතිවාසිකම් ඔවුන් සතු වන්නේ යැයි කියා සිටින අතර, ක්ලෙමන්ට් ඩයස් මහතා යටතේ සංවිධානය වී සිටින අනෙක් මාදැල් ධීවරයින් කණ්ඩායම විසින් හිමිකම් දක්වන අයිතිවාසිකම් පිළිබඳව එකී කණ්ඩායමට දේශික ජලතීරයේ එකී ප්‍රදේශය තුළ මාදැල් වටකිරීම සඳහා කිසියම් පාරම්පරික අයිතිවාසිකමක් නො මැති බව ද එම කණ්ඩායම විසින් එබඳු අයිතිවාසිකමක් ක්‍රියාවේ යොදවා නොමැති බවද යන කරුණු මත විරෝධය පළ කරති.

(ii) ක්ලෙමන්ට් ඩයස් මහතා යටතේ සංවිධානය වී සිටින මාදැල් ධීවරයින් කණ්ඩායම, දේශික ජලතීරයේ එකී මුහුදු ප්‍රදේශය තුල මාදැල් වටකිරීමේ අයිතිවාසිකම් ක්‍රියාවේ යෙදවූ කළමුල්ලේ එම්. කැතරින් ද මේරි පෙරේරා මහත්මියගෙන් මාදැල් බෝට්ටුවක් හා දැල් මිළදී ගැනීමත් සමග ඔවුන්ට ද එකී මුහුදු ප්‍රදේශය තුළ මාදැල් වටකිරීමේ අයිතියක් ලැබී ඇති බව ප්‍රකාශ කර සිටින අතර, එසේ මාදැල් වට කිරීමේ කටයුතු කරගෙන යාම ඔවුන්ගේ ජීවනෝපාය සඳහා අත්‍යාවශ්‍ය බව ද කියා සිටිති.

පැමිණිලිකරුවන් වන ක්ලෙමන්ට් ඩයස් සහ ඔහුගේ පුත්‍රයා වන බෙනඩික් ඩයස් සහ ඔවුන් විසින් සංවිධානය කර සිටින ධීවරයන් කණ්ඩායම පහත සඳහන් කරුණු පිළිගනිති.

(i) දැනට පවත්නා ආරාවුලට භාජනව ඇති සීනික්කර වරාය යනුවෙන් හා කළමුල්ල වරාය යනුවෙන් ද හැඳින්වෙන වරාය, ඔහු දන්නා අන්දමට අනාදිමත් කාලයක සිටම තනිකරම පාවිච්චි කරනු ලැබ ඇත්තේ කළමුල්ලෙ සලාගම වංශයේ අය විසිනි. මෙම වරායේ මාදැල් වට කිරීමේ අයිතිය තනිකරම හිමිව ඇත්තේ කළමුල්ලෙ සලාගම වංශයේ අයට සි.

(ii) ඔහුට හෝ වෙනත් වංශයක (කරාව වංශයද ඇතුළුව) කිසිම තැනැත්තකුට හෝ එකී වරායේ මසුන් ඇල්ලීම සඳහා කිසිම අයිතියක් නැත.

මෙම පිළිගැනීම අනුව. ක්ලෙමන්ට් ඩයස් සහ ඔහුගේ පුත්‍රයා වන බෙනඩික් ඩයස් ද ඇතුළුව ඔහු යටතේ සංවිධානය වී සිටින ධීවරයින් කණ්ඩායම, එකී වරායේ මසුන් ඇල්ලීම පිණිස ඔවුන්ගේ හිමිකම් ඉල්ලා සිටීම ඉවත් කරගන්නා අතර මේ වරායේ මසුන් ඇල්ලීම සඳහා දැනට අයිතිය ඇත්තේ බෙනඩික් සිල්වා සහ එම්. ඕ. පී. ගුණතිලක යන අයට පමණක් බව පිළිගනිති. මෙම කොන්දේසි ප්‍රකාරව ගරු ධීවර ඇමතිතුමා වෙත නිර්දේශ කිරීම පිළිබඳව ද ඔවුහු කැමැත්ත පළකරති.

මෙම විසඳීම සඳහා වගඋත්තරකාර පක්ෂය වෙනුවෙන් බෙනඩික් සිල්වා සහ එම්. ඕ. පී. ගුණතිලක පමණක් හා පෙත්සම්කරුගේ පක්ෂය වෙනුවෙන් ක්ලෙමන්ට් ඩයස් පමණක් පැමිණ සිටිති.

මේ අනුව ගරු ඇමතිතුමා වෙත නිර්දේශ කරමි.

ජේ. පී. එල්. ස්වාරිස්,
කොමසාරිස්,
කළමුල්ල ධීවර ආරවුල පිළිබඳ විභාගය.

1973 නොවැම්බර් මස 17 දින දීය.

12–418—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ධීවර ආඥාපනත (212 වැනි අධිකාරය)**

හලාවත ධීවර ආරාවුල

යථෝක්ත ධීවර ආරාවුල පිළිබඳව විභාගය පැවැත්වූ නිව්ටන් එදිරිසිංහ මහතාගේ වාර්තාව 1973 දෙසැම්බර් මස 29 වෙනි දින පෙ. ව. 10ට කොළඹ, ගාළු මුවදොර, ධීවර දෙපාර්තමේන්තුවේ ක්‍රීඩා ශාලාවේ දී කියවනු ලබන බව, ආරවුලට සහභාගී පක්‍ෂයන්ගේ හා එය පිළිබඳව උනන්දුවක් දක්වන අනිකුත් අයගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වී. ඇල්. සී. පීටර්ස්,
වැඩ බලන ධීවර අධ්‍යක්‍ෂ.

1973 දෙසැම්බර් මස 06 දින,
කොළඹදී ය.

12–522—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

# ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

## බුද්ධශ්‍රාවක ධර්මපීඨය—අනුරාධපුරය

### 1972 දෙසැම්බර් මස 31 වෙනි දිනට ශේෂ පත්‍රය

**විශ්ව විද්‍යාලයීය අරමුදල**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1971.10.1 වෙනි දින සමුච්චිත අරමුදල ... | 9,19,391 88 | |
| පසුගිය වසරේ වෙන් කළ බැරකම්වල ඉතුරුව එකතු කිරීම ... | 2,101 56 | |
| 1968–69 වසරේ විදුලි උපකරණ සඳහා වැය වී ඇති මුදල එකතු කිරීම ... | 54,610 58 | |
| | 9,76,104 02 | |
| වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුමේ ශේෂය ... | 1,85,324 99 | |
| | | 11,61,429 01 |

**ජංගම බැරකම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| විවිධ ණය හිමියෝ ... | 14,184 14 | |
| විගණකාධිපති ... | 2,000 0 | |
| දුම්රිය දෙපාර්තමේන්තුව | 2,208 65 | |
| උපචිත වියදම් ... | 7,046 37 | |
| සේවක ඇප මුදල් ... | 2,312 45 | |
| විශේෂ පරිත්‍යාග ... | 65 0 | |
| | | 27,816 61 |
| | | 11,89,245 62 |

විශ්ව විද්‍යාලයීය ස්ථාවර වත්කම් සඳහා 1971–72 වර්ෂය අවසානයේ ක්ෂය සමුච්චිත එකතුව රුපියල් 32,842.02 කි. නමුත් අධ්‍යාපනික කටයුතු සඳහා උපයෝගී කරගත් වත්කම් බැවින් ක්ෂය කපා හැර නොමැත.

**ස්ථාවර වත්කම්**

| | 71.10.1 | වර්ෂයේ අඩු කිරීම් | ක්ෂය | වර්ෂයේ එකතු කිරීම් | |
|---|---|---|---|---|---|
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| ගෘහ භාණ්ඩ ... | 83,652 89... | — ... | — ... | 15,091 50... | 98,744 39 |
| ගෘහ භාණ්ඩ සං.නි. ... | 7,765 63... | — ... | 1,118 66... | — ... | 6,646 97 |
| විදුලි උපකරණ ... | 64,989 17... | — ... | — ... | 1,019 38... | 66,008 55 |
| කාර්යාලයීය උපකරණ | 9,314 61... | — ... | — ... | 1,464 0... | 10,778 61 |
| විවිධ උපකරණ ... | 13,365 97... | 78 42... | — ... | 2,238 60... | 15,526 15 |
| විවිධ උපකරණ සං.නි. | 2,451 87... | — ... | 377 35... | — ... | 2,074 52 |
| පුස්තකාල පොත් ... | 45,399 39... | — ... | — ... | 9,931 34... | 55,330 73 |
| වාහන ... | 45,926 58... | — ... | — ... | — ... | 45,926 58 |
| | 2,72,866 11 | 78 42 | 1,496 01 | 29,744 82 | 3,01,036 50 |

**ජංගම වත්කම්**

| | රු. ශ. | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|
| වීදුරු හා පිඟන් බඩු ... ... | 4,356 57 | | |
| පිහියා හැඳි ගෑරුප්පු ... ... | 491 86 | | |
| රෙදි පිළි ... ... ... | 11,555 28 | | |
| | | 16,403 71 | |
| අත්තිකාරම් ගෙවීම් ... ... | 980 62 | | |
| සේවක අත්තිකාරම් ... ... | 7,606 93 | | |
| විවිධ ණය ගැතියන් ... ... | 1,960 19 | | |
| කලින් ගෙවීම් ... ... ... | 479 04 | | |
| | | 11,026 78 | |
| සේවක ඇප තැන්පත් මුදල් ... ... | 2,312 45 | | |
| විවිධ තැන්පත් මුදල් ... ... | 430 0 | | |
| භාණ්ඩාගාරයේ පොදු තැන්පත් අරමුදල ... | 1,09,101 11 | | |
| අනුරාධපුර ලංකා බැංකුවේ අචල තැන්පත් ගිණුමේ | 6,39,000 0 | | |
| අනුරාධපුර ලංකා බැංකුවේ අචල තැන්පත් ගිණුමේ පොලී ... ... ... | 75,605 0 | | |
| | | 8,26,448 56 | |
| | | | 8;53,879 05 |

**මුදල්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| අනුරාධපුර ලංකා බැංකුවේ ... ... | 33,565 38 | |
| අතේ ... ... ... | 764 69 | |
| | | 34,330 07 |
| | | 11,89,245 62 |

එන්. ටී. කේ. ජී. සේනාධිර,
ලේකම්,

ජේ. ඇම්. ඒ. ජයසේකර,
ගණකාධිකාරී.

බුද්ධශ්‍රාවක ධර්මපීඨය,
අනුරාධපුරය.

1968 අංක 16 දරන බුද්ධශ්‍රාවක ධර්මපීඨ පනතේ 29 වැනි වගන්තිය ප්‍රකාර, 1971 ඔක්තෝබර් මස 1 වැනි දිනෙන් ආරම්භව දෙසැම්බර් 31 වැනි දිනෙන් අවසන් වූ කාලය සඳහා බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ ගිණුම් මගේ විධානය යටතේ විගණනය කරන ලදී. විගණනයේදී මට අවශ්‍ය වූ සියළුම තොරතුරු සහ පහදාදීම් මා විසින් ලබා ගත් බවත්, මීට අමුණා ඇති පීආර්–2/බුශ්‍රාධපී. 1/71–72 හා 1973 අගෝස්තු මස 04 වැනි දින දරණ මගේ වාර්තාවේ නිරීක්ෂණයන්ට යටත්ව මෙහි ඉහත දක්වා ඇති ශේෂ පත්‍රය සහ ඒවා සම්බන්ධ මුදල් ප්‍රකාශයන් 1971 ඔක්තෝබර් මස 1 වැනි දිනෙන් ආරම්භව, 1972 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වූ කාලයේ බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ මුදල් තත්ත්වය සහ එම කාලය තුළදී එහි වැඩ කටයුතු කර ගෙන යාමෙන් ලත් ප්‍රතිඵල සාධාරණ හා සත්‍ය ලෙස පිළිබිඹු වන සේ සකස් කොට ඇති බව මගේ හැඟීමයි.

එස්. එදිරිසිංහ,
විගණකාධිපති වෙනුවට.

1973 අගෝස්තු මස 04 වැනි දින,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
කොළඹ 7.

බුද්ධශ්‍රාවක ධර්මපීඨ සංචාරක නිවසේ 1972 දෙසැම්බර් මස 31 වෙනිදට අවසන් වූ වර්ෂය සඳහා ආදයම් සහ වියදම් ගිණුම

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|---|
| වැටුප් : භාරකාර කෝකි ... ... | 4,018 60 | | නවාතැන් ගාස්තු ... ... ... | 2,988 40 |
| මුර කිරීම් ... ... | 56 0 | | විදුලිය ආදයම් ... ... ... | 193 60 |
| | | 4,074 60 | වතුර පොම්පයේ ආදයම... ... ... | 28 0 |
| නඩත්තුව සඳහා වියදම ... ... | | 2,196 29 | දුරකතන ආදයම ... ... ... | 11 20 |
| දුර කථනය ... ... | | 464 20 | | |
| විදුලිය වියදම ... ... | | 383 55 | | |
| වතුර පොම්පය නඩත්තුව ... ... | | 393 0 | | |
| රෙදි පිළි ... ... ... | | 103 50 | | |
| රෙදි සේදීමේ කුලිය ... ... | | 126 95 | | |
| ක්ෂය : ගෘහ භාණ්ඩ ... ... | 443 14 | | | |
| විවිධ උපකරණ ... ... | 138 30 | | | |
| | | 581 44 | ආදයමට වැඩි වියදම ... ... ... | 5,102 33 |
| | | 8,323 53 | | 8,323 53 |

විශ්ව විද්‍යාලයීය අරමුදල

| | රු. ශ. | | රු. ශ. | රු. ශ. |
|---|---|---|---|---|
| ශේෂ පත්‍රයට ගෙන ගිය ශේෂය ... ... | 9,76,104 02 | 1971.10.01 වැනි දින ශේෂය.... ... | | 9,19,391 88 |
| | | පසුගිය වසරේ වෙන් කළ බැරකම්වල ඉතුරුව | | |
| | | ග්‍රාම සංවර්ධන හා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව ... ... | 1,001 56 | |
| | | විගණකාධිපති (ගණන් පරීක්ෂණ ගාස්තු) ... | 1,100 0 | |
| | | | | 2,101 56 |
| | | 1968-69 වසරට අයත්, එම ගිණුම්වලට ඇතුළත් නොවූ මූලධන වැය | | |
| | | විදුලි උපකරණ ... ... | | 54,610 53 |
| | 9,76,104 02 | | | 9,76,104 02 |

1972 දෙසැම්බර් මස 31 වෙනිදට අවසන්වූ වර්ෂය සඳහා ආදයම් සහ වියදම් ගිණුම

| | රු. ශ. | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|---|
| වැටුප් | | | මහා භාණ්ඩාගාරයේ ප්‍රතිපාදිත අරමුදල ... ... | 4,75,000 0 |
| නිලධාරි සහ සුළු සේවක ... | 1,30,855 0 | | ශිෂ්‍ය භික්ෂු නඩත්තුව සඳහා ආධාර ... ... | 1,566 85 |
| බාහිර කථිකාචාර්ය හා උපදේශක ... | 17,394 53 | | ගෙවල් කුලී ... ... ... | 1,500 0 |
| | | 1,48,249 53 | සිවුපසය සඳහා ආධාර ... ... ... | 305 0 |
| අතිකාල දීමනා ... ... | | 2,060 41 | විවිධ ආදයම් ... ... ... | 435 32 |
| දයක මණ්ඩලයේ සභාපතිට දීමනා ... | | 11,250 0 | අචල තැන්පත් ගිණුමේ පොළිය ... ... | 79,716 79 |
| බලමණ්ඩලත්‍රයේ රැස්වීම් දීමනා ... | | 6,875 0 | | |
| **ගමන් වියදම් හා යැපීම් දීමනා** | | | | |
| බලමණ්ඩලත්‍රයේ ... ... | 6,377 30 | | | |
| බාහිර කථිකාචාර්ය මණ්ඩලය ... | 5,354 80 | | | |
| නිලධාරි සහ සුළු සේවක ... | 3,716 85 | | | |
| | | 15,448 95 | | |
| **ගමන් වියදම්** | | | | |
| කථිකාචාර්ය භික්ෂූන් වහන්සේ ... | 17,245 40 | | | |
| ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ ... | 8,971 92 | | | |
| | | 26,217 32 | | |
| මුද්‍රණ ලිපි ද්‍රව්‍ය හා දැන්වීම් ... | | 14,561 83 | | |
| තැපැල් දුරකථන හා විදුලි පණිවුඩ ... | | 3,013 24 | | |
| ආචාර්ය හා ශිෂ්‍ය භික්ෂු සිවුපසය ... | | 80,980 83 | | |
| විදුලිය වියදම් ... ... | | 23,469 13 | | |
| ගොඩනැගිලි නඩත්තුව ... | | 1,580 73 | | |
| අංක 2 බංගලාවේ නඩත්තුව ... | | 3,402 01 | | |
| වාහන නඩත්තුව ... ... | | 17,439 81 | | |
| ගණන් පරීක්ෂණ ගාස්තු ... | | 2,000 0 | | |
| බැංකු ගාස්තු ... ... | | 499 53 | | |
| රෙදි සේදීමේ කුලිය ... ... | | 423 95 | | |
| පුවත් පත් සඟරා ... ... | | 1,012 65 | | |
| ආචාර්ය හා ශිෂ්‍ය භික්ෂු වෛද්‍ය පහසුකම් | | 5,922 25 | | |
| සේවක නිල ඇඳුම් ... ... | | 1,431 10 | | |
| උපකරණ නඩත්තුව ... ... | | 838 0 | | |
| ධර්මපීඨයේ වත්ත පිරිසිදු කිරීම ... | | 335 85 | | |
| සංචාරක නිවසේ ආදයමට වැඩි වියදම ... | | 5,102 33 | | |
| විවිධ වියදම් ... ... | | 1,084 52 | | |
| වියදමට වැඩි ආදයම ... ... | | 1,85,324 99 | | |
| | | 5,58,523 96 | | 5,58,523 96 |

එන්. ටී. කේ. ජී. සේනාධීර,
ලේකම්.

ජේ. ඇම්. ඒ. ජයසේකර,
ගණකාධිකාරී.

### බුද්ධශ්‍රාවක ධර්මපීඨය—අනුරාධපුරය—ස්ථාවර වත්කම් ක්ෂය ලේඛනය, 1971–72

| | | 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | 1971.10.1 දිනට වටිනාකම | 71/72 වර්ෂය තුළ අඩු කිරීම | ශේෂය 1-2 | 71.10.1 දිනට ක්ෂය එකතුව | 71/72 වර්ෂය ක්ෂය | 72.12.31 දිනට ක්ෂය එකතුව 4–5 | 71/72 වර්ෂය අවසාන ශුද්ධ වටිනාකම 3–6 | 71/72 වර්ෂය තුළ එකතු කිරීම | 72.12.31 දිනට ක්ෂය කළ මුළු වටිනාකම 7–8 | 72.12.31 ට ක්ෂය නොකළ මුළු වටිනාකම 3–8 |
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| **විශ්ව විද්‍යාලයය :** | | | | | | | | | | | |
| ගෘහ භාණ්ඩ | 5%... | 83,652 89 | — | 83,652 89 | 7,085 69 | 4,785 45 | 11,871 14 | 71,781 75 | 15,091 50 | 86,873 25 | 98,744 39 |
| විදුලි උපකරණ | 5%... | 64,989 17 | — | 64,989 17 | 5,843 46 | 3,696 61 | 9,540 07 | 55,449 10 | 1,019 38 | 56,468 48 | 66,008 55 |
| කායවිද්‍යාලයීය උපකරණ | 5%... | 9,314 61 | — | 9,314 61 | 797 61 | 532 31 | 1,329 92 | 7,984 69 | 1,464 0 | 9,448 69 | 10,778 61 |
| විවිධ උපකරණ | 5%... | 13,365 97 | 78 42 | 13,287 55 | 870 90 | 776 04 | 1,646 94 | 11,640 61 | 2,238 60 | 13,879 21 | 15,526 15 |
| පුස්තකාල පොත් | — ... | 45,399 39 | — | 45,399 39 | — | — | — | 45,399 39 | 9,931 34 | 55,330 73 | 55,330 73 |
| වාහන | 10%... | 45,926 58 | — | 45,926 58 | 3,100 71 | 5,353 24 | 8,453 95 | 37,472 63 | — | 37,472 63 | 45,926 58 |
| | | 2,62,648 61 | 78 42 | 2,62,570 19 | 17,698 37 | 15,143 65 | 32,842 02 | 2,29,728 17 | 29,744 82 | 2,59,472 99 | 2,92,315 01 |
| **සංචාරක නිවස :** | | | | | | | | | | | |
| ගෘහ භාණ්ඩ | 5%... | 7,765 63 | — | 7,765 63 | 675 52 | 443 14 | 1,118 66 | 6,646 97 | — | 6,646 97 | 7,765 63 |
| විවිධ උපකරණ | 5%... | 2,451 87 | — | 2,451 87 | 239 05 | 138 30 | 377 35 | 2,074 52 | — | 2,074 52 | 2,451 87 |
| | | 10,217 50 | — | 10.217 50 | 914 57 | 581 44 | 1 496 01 | 8,721 49 | — | 8,721 49 | 10,217 50 |
| මුළු එකතුව | ... | 2,72,866 11 | 78 42 | 2,72,787 69 | 18,612 94 | 15,725 09 | 34,338 03 | 2,38,449 66 | 2,97,44 82 | 2,68,194 48 | 3,02,532 50 |

### බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ අර්ථසාධක අරමුදල

### 1972 දෙසැම්බර් මස 31 වෙනි දිනට අවසන් වූ වර්ෂය සඳහා ආදයම් හා වියදම් ගිණුම

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| සාමාජිකයන්ගේ ගිණුම්වලට බැර කරන ලද පොළිය ... | 810 79 | පොළිය—ලංකා බැංකුවේ මුදල තැන්පත් කිරීමෙන් ... | 866 27 |
| ශේෂය ... ... ... ... | 55 48 | | |
| | 866 27 | | 866 27 |

### බුද්ධශ්‍රාවක ධර්මපීඨයේ සේවක අර්ථසාධක අරමුදලේ 1972 දෙසැම්බර් 31 වෙනි දිනට ශේෂ පත්‍රය

| **දයක මුදල්** | 1971.10.1 රු. ශ. | 1971/72 රු. ශ. | රු. ශ. | **තැන්පත් කිරීම** | රු. ශ. |
|---|---|---|---|---|---|
| විශ්ව විද්‍යාලයය ... | 8,943 17 | ... 8,119 82 | | අනුරාධපුර ලංකා බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම ... | 28,428 77 |
| සේවක ... ... | 5,962 04 | ... 5,413 15 | | | |
| | 14,905 21 | 13,532 97 | | | |
| වර්ෂයේ ගෙවූ මුදල් අඩුකළා | 60 91 | ... 1,210 05 | | | |
| | 14,844 30 | 12,322 92 | | | |
| | | | 27,167 22 | | |
| සාමාජිකයන්ගේ ගිණුම්වලට බැරකරන ලද පොළිය 2.5% ... | | | 1,133 20 | | |
| ලාභය (ඉතිරි පොළිය) ... ... ... | | | 128 35 | | |
| | | | 28,428 77 | | 28,428 77 |

අත්සන් කළේ/එන්. ටී. කේ. ජී. සේනාධීර,
ලේකම්.

ජේ. ඇම්. ඒ. ජයසේකර,
ගණකාධිකාරී.

12-331—73.12.14 දින අංක 90 දරන ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## දැන්වීමයි

1958 අංක 29 දරණ සතුන් පිළිබඳ පනත යටතේ, ගවයින් හන නිවරණය කිරීම පිළිබඳ නීති මාලාවට අනුව, කැගල්ල දිස්ත්‍රික්කයේ ගල්බඩ කෝරළයේ නැගෙනහිර ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය සහ ගල්බඩ කෝරළයේ බටහිර ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශය තුළ, ගවයින් හන නිවරණය කිරීමේ වැඩ සටහන මහජනයාගේ දැනගැනීම සඳහා එම පාලන දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති තැන්පත් කපිල පතිරණ විමලධර්ම වන මම මෙහි පහත ප්‍රසිද්ධ කරමි.

කේ. පතිරණ විමලධර්ම,
කැගල්ල දිස්ත්‍රික්කයේ දිසාපති.

1973 නොවැම්බර් මස 22 වෙනි දින,
කැගල්ල කච්චේරියේ දී ය.

ගල්බඩ කෝරළය නැගෙනහිර ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාශය—මාවනැල්ල

| ග්‍රාමසේවක කොට්ඨාශ අංකය | ග්‍රාමසේවක කොට්ඨාශයේ නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය | වේලාව සිට පෙ.ව. | වේලාව දක්වා ප.ව. |
|---|---|---|---|---|---|
| 15 | අම්බුලුගල | කලහුදෙනියේ වත්ත | 1973.12.01 | 8.00 | 5.00 |
| | එම | මකුලුගහතැන්න | 1973.12.02 | 8.00 | 5.00 |
| 15ඒ. | ගල්අතර උඩුවේවෙල | උඩුවේවෙල යාලපොලවත්ත | 1973.12.27 | 8.00 | 5.00 |
| 16ඒ. | දීවල උඩගම | කලඹටුවාව වත්ත | 1973.12.15 | 8.00 | 5.00 |
| | එම | අහස්ලියැද්ද වත්ත | 1973.12.16 | 8.00 | 5.00 |
| 16බී. | දීවල පල්ලේගම | ජවරන්ගෙදර වත්ත | 1973.12.15 | 8.00 | 5.00 |
| | එම | රංගල්ලැහේන | 1973.12.16 | 8.00 | 5.00 |
| 18 | ලෙව්කේ | හිරතලේ වත්ත | 1973.12.19 | 8.00 | 5.00 |
| | එම | අලුදෙනියේ වත්ත | 1973.12.20 | 8.00 | 5.00 |
| 19 | රන්කොත්දිවෙල | ග්‍රාමසේවක කාර්යාලය අසල | 1973.12.15 | 8.00 | 5.00 |
| 19ඒ. | උතුවන්කන්ද | බණ්ඩාර වත්ත | 1973.12.20 | 8.00 | 5.00 |
| | එම | අඹමලුව වත්ත | 1973.12.27 | 8.00 | 5.00 |
| | වැගන්තලේ | ඉලුක්ගොඩ පාලම අසල | 1973.12.11 | 8.00 | 5.00 |
| | එම | දනාගම වත්ත, සමුපකාර ප්‍රාදේශිකය අසළ | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | අංවාරම අංක 106 දරණ ඉඩම | 1973.12.13 | 8.00 | 5.00 |
| 21 | කඩිගමුව | ගිරාඹෙවත්ත | 1973.12.04 | 8.00 | 5.00 |
| | එම | උඩුගම ග්‍රාම සංවර්ධන සමිති ශාලාව අසළ | 1973.12.08 | 8.00 | 5.00 |
| | එම | හලාගිරිය පාසැල අසළ | 1973.12.11 | 8.00 | 5.00 |
| 22 | බැද්දවෙල | උඩබැද්දවෙල තැබැරුම් වත්ත | 1973.12.05 | 8.00 | 5.00 |
| | එම | යටිවල්දෙනියේ පොදු සුසාන භූමිය | 1973.12.07 | 8.00 | 5.00 |
| 22ඒ. | ගංගොඩ | ග්‍රාමසේවක කාර්යාලය අසළ | 1973.12.07 | 8.00 | 5.00 |
| | එම | ගංගොඩ එස්. පී. පියදසගේ කඩය අසළ | 1973.12.05 | 8.00 | 5.00 |
| 23 | මාකෙහෙල්වල | මාකෙහෙල්වල අම්බලම අසළ | 1973.12.27 | 8.00 | 5.00 |
| | එම | වලගොඩ අතුකෝරළගේ වත්ත | 1973.12.28 | 8.00 | 5.00 |
| | එම | ගෙදර කැලේ වත්ත | 1973.12.29 | 8.00 | 5.00 |
| 24 | රංදිවල | උඩුමහන අම්බලම අසළ | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | නැපලාන රිටිගල වත්ත | 1973.12.13 | 8.00 | 5.00 |
| 24ඒ. | දුනුගම-මාලියැද්ද | බණ්ඩාර වත්ත | 1973.12.29 | 8.00 | 5.00 |
| 25 | මාකඩවර | හේනේකඩේ ගෙදර වත්ත | 1973.12.16 | 8.00 | 5.00 |
| | එම | උස්සපිටිය වත්ත | 1973.12.18 | 8.00 | 5.00 |
| 25ඒ. | මොල්ලිගොඩ | පෝඩාපේ වත්ත | 1973.12.16 | 8.00 | 5.00 |
| | එම | ඔයදෙක හාවුනතැන වත්ත | 1973.12.18 | 8.00 | 5.00 |
| 26 | කහවන්දල | ඔයගාව වත්ත | 1973.12.11 | 8.00 | 5.00 |
| | එම | පුස්සැල්ල මුල හේන | 1973.12.12 | 8.00 | 5.00 |
| 27 | අළුත්නුවර | අයගම උඩවීදිය ආරච්චිලාගේ වත්ත | 1973.12.28 | 8.00 | 5.00 |
| 28 | ඉඩම්පිටිය | ගිනිහපුවේ වත්ත | 1973.12.13 | 8.00 | 5.00 |
| | | අල්පිටිය රාල්ලාගේ වත්ත | 1973.12.14 | 8.00 | 5.00 |
| 29 | හිඟුල | කෙතේ වත්ත | 1973.12.05 | 8.00 | 5.00 |
| | එම | ළිඳ ගාව වත්ත | 1973.12.06 | 8.00 | 5.00 |
| | එම | මා ඉඹුලේ වත්ත | 1973.12.08 | 8.00 | 5.00 |
| 30 | කිරංගදෙනිය | කෝන්ගහමුල වත්ත | 1973.12.11 | 8.00 | 5.00 |
| | එම | මාරාවේ වත්ත | 1973.12.16 | 8.00 | 5.00 |
| 30ඒ. | උයන්වත්ත | හොලා උල්ලේ වත්ත | 1973.12.12 | 8.00 | 5.00 |
| 31 | ඒදඩුවාව | කෙසෙල් වත්ත | 1973.12.15 | 8.00 | 5.00 |
| | එම | වට්ටාලන්දේ වත්ත | 1973.12.16 | 8.00 | 5.00 |
| 33 | තල්ගමුව අට්ටාපිටිය | අලකොළදෙනියේ වත්ත | 1973.12.18 | 8.00 | 5.00 |
| | එම | පරගහ තැන්නේ වත්ත | 1973.12.19 | 8.00 | 5.00 |
| 34 | වේරකේ | වේරකේ වත්ත | 1973.12.28 | 8.00 | 5.00 |
| | එම | හිටිනාවත්ත | 1973.12.29 | 8.00 | 5.00 |
| 35 | කුඹල්ගම | දම්ටියේ වත්ත | 1973.12.06 | 8.00 | 5.00 |
| 36 | එරමිනිගම්මන | හිංනාරන් දෙනියේ වත්ත | 1973.12.13 | 8.00 | 5.00 |
| | එම | පල්ලේගෙදර වත්ත | 1973.12.14 | 8.00 | 5.00 |
| 37 | කුරගල | වලව්ව වත්ත | 1973.12.22 | 8.00 | 5.00 |
| 37 | කුරගල | සීයඹලාගහ කොටුව | 1973.12.23 | 8.00 | 5.00 |
| 38 | පල්ලිපෝරුව | ඉහම්මාතගම වාංගොල්ලේ වත්ත | 1973.12.19 | 8.00 | 5.00 |
| | එම | කිඹිබොට්ටේ වත්ත | 1973.12.21 | 8.00 | 5.00 |
| 39 | දුම්බුලුවාව | දිවි කඩේ වත්ත | 1973.12.20 | 8.00 | 5.00 |
| 40 | කෙහෙල්පන්නල | කැඹිලිගහ වත්ත | 1973.12.27 | 8.00 | 5.00 |
| | එම | පන්සලේ වත්ත | 1973.12.28 | 8.00 | 5.00 |

ගල්බඩ කෝරළය බටහිර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාශය—අරනායක

| ග්‍රාමසේවක කොට්ඨාශ අංකය | ග්‍රාමසේවක කොට්ඨාශයේ නම | හංවඩු ගැසීමේ ස්ථානය | දිනය | වේලාව සිට පෙ.ව. | වේලාව දක්වා ප.ව. |
|---|---|---|---|---|---|
| 16 | වාකිරිගල | වාකිරිගල අම්බලම අසළ | 1973.12.27 | 8.00 | 5.00 |
| | එම | ගුරුබැවිල විද්‍යාලය අසළ | 1973.12.28 | 8.00 | 5.00 |
| | එම | මිල්ලන්ගොඩ දේවාලය අසළ | 1973.12.29 | 8.00 | 5.00 |
| | එම | ඇරව්පල කඩමන්ඩිය අසළ | 1973.12.30 | 8.00 | 5.00 |
| | එම | වැවල යූ. වී. විලියම් මහතාගේ නිවස අසළ | 1973.12.31 | 8.00 | 5.00 |
| 17 | උස්සාපිටිය | මහඅරඹ වත්ත | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | පඹුරුගහමුල හේන | 1973.12.13 | 8.00 | 5.00 |
| | එම | දෙමෝදර වත්ත | 1973.12.14 | 8.00 | 5.00 |
| 41 | අරම | ඇතුල්ගෙ වත්ත | 1973.12.05 | 8.00 | 5.00 |
| | එම | තුත්තිරිපිටියේ වත්ත | 1973.12.06 | 8.00 | 5.00 |
| 42 | හකුරුගම්මන | ග්‍රාමසේවක කාර්යාලය අසළ | 1973.12.20 | 8.00 | 5.00 |
| 43 | අරනායක | උග්ගොඩ නිත්තවල වත්ත | 1973.12.20 | 8.00 | 5.00 |
| 44 | තල්ගස්පිටිය | කහටපිටියෑ වත්ත | 1973.12.11 | 8.00 | 5.00 |
| | එම | වික්‍රම ආරච්චිගේ වත්ත | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | කෝපිලන්දේ හේන | 1973.12.13 | 8.00 | 5.00 |
| 43ඒ. | අම්බලකන්ද | පෝඩාපේ ග්‍රාමසේවක කාර්යාලය අසළ | 1973.12.07 | 8.00 | 5.00 |
| | එම | අම්බලකන්දේ නාගහමුල අසළ | 1973.12.08 | 8.00 | 5.00 |
| 45 | දිප්පිටිය | ඉද්දවල කොකෝවත්ත | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | මාවතගොඩ ගම්බද උසාවිය අසළ | 1973.12.13 | 8.00 | 5.00 |
| | එම | පැලවත්ත මේනම | 1973.12.14 | 8.00 | 5.00 |
| 46 | නිකපිටිය | වැරැල්ලේ හේන | 1973.12.11 | 8.00 | 5.00 |
| | එම | උඩගෙදර වත්ත | 1973.12.12 | 8.00 | 5.00 |
| | එම | පීලි කුඹුරේ පිල්ලෑව | 1973.12.13 | 8.00 | 5.00 |
| | එම | ජයමංගල ගෙදර වත්ත | 1973.12.14 | 8.00 | 5.00 |
| | එම | ඉලුක්වත්තේ ගෙදර වත්ත | 1973.12.15 | 8.00 | 5.00 |
| 47 | හත්ගම්පල | මිනිපිටියේ වත්ත | 1973.12.19 | 8.00 | 5.00 |
| | එම | එළහිපිටිය විදුහලට අයත් අඹතැන්නේ වත්ත | 1973.12.20 | 8.00 | 5.00 |
| 47ඒ. | දෙබත්ගම | හිටිනා වත්ත | 1973.12.10 | 8.00 | 5.00 |
| | එම | පල්ලෙහා වත්ත | 1973.12.11 | 3.00 | 5.00 |
| | එම | පී. ඇස්. ගුණතිලකගේ ඉඩම | 1973.12.12 | 8.00 | 5.00 |
| 45ඒ. | ගැවිලිපිටිය | අකුංඩපොල වත්ත | 1973.12.28 | 8.00 | 5.00 |
| | එම | ඇල්. ගුනදරා මයාට අයත් මල්මඩුගෙදර වත්ත | 1973.12.30 | 8.00 | 5.00 |

12-391—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—උතුරු මැද පළාත**

**රථවාහන සඳහා මාර්ගය වසා තැබීම**

පුත්තලම-ත්‍රිකුණාමල මාර්ගයේ 43 3/4 සැතපුම සිට 45 සැතපුම දක්වා සැම වාහනයක් සඳහාම 1973. 12. 15 වන දින සිට නැවත දන්වනතුරු වසා තබන බව සියලුම මගීන්ගේ හා මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් දැනුම් දෙමි.

පුත්තලම-ත්‍රිකුණාමල අතුරු මාර්ගය මේ වෙනුවට උපයෝගී කර ගන්නා මෙන් සියලු රියදුරන් වෙත දන්වමි.

පී. එස්. වික්‍රමසිංහ,
දිසාවැඩ අධ්‍යක්ෂ—උතුරු මැද දිසාව,
අනුරාධපුරය.

1973. 12. 5 දින දීය.

12-483—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| 60. සී/ස. ගුරුදෙනිය කිරිමැටිය විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73.09.24 |
| 61. සී/ස. පට්ටිපොල අඹේවෙල විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73.09.25 |
| 62. සී/ර. කඩදොර කාන්තා ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 73.09.25 |
| 63. සී/ස තල්දූව විවිධ සේවා සමුපකාර සමිතිය ... | 73.09.25 |
| 64. සී/ස. මානානෙයි සමුපකාර කඩ සමිතිය ... | 73.09.25 |
| 65. සී/ර. හේනේපොල සකසුරුවම්කම හා ණය ගනු දෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... | 73.09.25 |
| 66. සී/ස. කොට්ටුකච්චිය සමුපකාර කඩ සමිතිය ... | 73.09.25 |
| 67. සී/ස. ආන්ඩිමුනෙයි විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73.09.25 |
| 68. සී/ස. වාසවිලාන් උතුරු මධ්‍යම ණය දෙන සමුපකාර සමිතිය ... ... | 73.09.25 |
| 69. සී/ස. වාසවිලාන් දකුණු බස්නාහිර ණය දෙන සමුපකාර සමිතිය ... ... | 73.09.25 |
| 70. සී/ස. හතමුන විවිධ සේවා සමුපකාර සමිතිය ... | 73.09.27 |
| 71. සී/ස. නාලවලාන විවිධ සේවා සමුපකාර සමිතිය ... | 73.09.28 |
| 72. සී/ර. කුඩාතට්ටියාව ට්‍රැක් 6 සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... | 73.09.28 |
| 73. සී/ර. අඩම්පනේ සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... ... | 73.09.28 |
| 74. සී/ස. මහේස්වරී ධීවර සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 75. සී/ස. පේමචන්ද්‍රා ධීවර සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 76. සී/ස. මීසලායි දකුණ පාලගියාඩි විනායගාර් ධීවර සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 77. සී/ස. මහිලඩිතිවු පලයාන්මූගා සමුපකාර කඩ සමිතිය ... ... | 73.09.29 |
| 78. සී/ස. මුනෙයි කාඩු බාලචන්ද්‍රා සමුපකාර කඩ සමිතිය ... ... | 73.09.29 |
| 79. සී/ස. කුරුක්කාල්මඩම් සමුපකාර කඩ සමිතිය ... | 73.09.29 |
| 80. සී/ස. කාරයිනගාර් තෝප්පුකාඩු කොහු කර්මාන්ත කරුවන්ගේ සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 81. සී/ස. මඩුකොටන් අරාව විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 82. සී/ර. විලබය සකසුරුවම්කම හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 83. සී/ස. සේරන්කඩ සමුපකාර කඩ සමිතිය ... | 73.09.29 |
| 84. සී/ස. පැල්වැහැර සමුපකාර කඩ සමිතිය ... | 73.09.29 |
| 85. සී/ස. එක්නැලිගොඩ ගැමුණු තරුණ ගොවීන්ගේ සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 86. සී/ර. තපස්සරවත්ත ණය දෙන සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 87. සී/ර. කීණගහවිල ණය දෙන සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 88. සී/ස. ඉඹුලේගොඩ සකසුරුවම්කම හා ණය ගනු දෙනු පිළිබඳ සමු. සමිතිය ... | 73.09.29 |
| 89. සී/ස. ඇත්කඳුර සමුපකාර කඩ සමිතිය ... | 73.09.29 |
| 90. සී/ස. උණවටුන ඔරුපන්නකරුවන්ගේ ණය ගනු දෙනු කිරීමේ සමු. සමිතිය ... | 73.09.29 |
| 91. සී/ස. මුස්සන්දපොත කාන්තා ඉතිරි කිරීමේ සමු. සමිතිය ... ... ... | 73.09.29 |
| 92. සී/ස. කැළණිපුර විවිධ සේවා සමුපකාර සමිතිය ... | 73.09.30 |
| 93. සී/ස. කටුගහගේන විවිධ සේවා සමුපකාර සමිතිය ... ... | 73.09.30 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973.11.21 වැනි දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
ආදිපාද වීදිය, කොළඹ 1.

12-360—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) පනත**

**සමුපකාර සමිති වසා දැමීමේ කටයුතු අවසන් කිරීම**

පහත සඳහන් සමිති එම සමිති නම් ඉදිරියේ සඳහන් කර ඇති දිනදී වසා දමන ලද බව 1970 අංක 35 දරණ සමුපකාර සමිති (විශේෂ විධිවිධාන) 9 වෙනි පනතේ (2) වෙනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| සමිතියේ නම | වසා දමන ලද දිනය |
|---|---|
| 1. සී/ස. රත්මල්කඩුව වඩු කාර්මිකයින්ගේ සමුපකාර සමිතිය ... ... | 73.09.14 |
| 2. සී/ස. මිරිගල්ල කුකුළන් ඇති කරන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | 73.09.14 |
| 3. සී/ස. සල්පිටි කෝරළයේ ණය දෙන සමුපකාර සමිති සංගමය ... ... | 73.09.14 |
| 4. සී/ස. සංගීත හා නාට්‍ය ශාලා පාසල් සමුපකාර සුභ සාධක සමිතිය ... .. | 73.09.14 |
| 5. සී/ස. ගාලු උසාවි සැකසුරුවම්කම් හා මුදල් ඉතිරි කිරීමේ සමුපකාර සමිතිය ... ... | 73.09.15 |
| 6. සී/ස. හියාරේ තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... ... | 73.09.15 |
| 7. සී/ස. පාදුගමන් මහා විද්‍යාලයීය සැපයීම් හා සකසුරුවම් සමුපකාර සමිතිය ... | 73.09.20 |
| 8. සී/ස. පුත්තූකුඩිඉරිප්පු එළුවන් ඇති කරන්නන්ගේ සමුපකාර සමිතිය ... ... | 73.09.20 |
| 9. සී/ස. පත්තිවාර්කර්නි ගනේස් ආනන්ද ණය දෙන සමුපකාර සමිතිය ... ... | 73.09.20 |
| 10. සී/ර. කට්ටාන්කුඩි ඩිම්සන් 1 ජින්නා කාන්තා ණය දෙන සමුපකාර සමිතිය ... | 73.09.20 |
| 11. සී/ස. වාන්කාලයි ධීවරයින්ගේ නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... | 73.09.20 |
| 12. සී/ස. උන්නිච්චායි ජනපදයේ සමුපකාර කඩ සමිතිය | 73.03.20 |
| 13. සී/ස. මියුවුවල් ගෘහ නිෂ්පාදන සමුපකාර සමිතිය | 73.09.20 |
| 14. සී/ස. පින්නලන්ද තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 73.09.24 |
| 15. සී/ස. කොට්ටාවපේරුව ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය ... | 73.09.24 |
| 16. සී/ස. වලහපිටිය කාන්තා සමුපකාර සමිතිය ... | 73.09.25 |
| 17. සී/ස. ගාල්ලේ කාන්තා සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 18. සී/ස. කොළඹ දිස්ත්‍රික්ක දකුණ ගොවි ද්‍රව්‍ය නිපදවීමේ හා අලෙවි කිරීමේ සමුපකාර සමිතිය | 73.09.29 |
| 19. සී/ස. මඩකලපුව සමුපකාර නිලධාරීන්ගේ සුභසාධක සමුපකාර සමිතිය ... ... | 73.09.28 |
| 20. සී/ස. කට්ටාන්කුඩි ඉස්ලාමියා තරුණ ගොවීන්ගේ ගොවි කර්මාන්ත සමුපකාර සමිතිය ... | 73.09.29 |
| 21. සී/ර. තම්පලාකාමම් බටහිර අංක 8 ණය දෙන සමුපකාර සමිතිය ... ... | 73.09.29 |
| 22. සී/ස. හසානියා සමුපකාර ගොවි සමිතිය ... | 73.09.30 |

ආර්. බී. රාජගුරු,
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්.

1973.11.21 වෙනි දින,
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,
ආදිපාද වීදිය, තැ. පෙ. 419,
කොළඹ 1.

12-364—73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

**වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුව**

**සුළු රබර් වතු හිමියන්ට කරනු ලබන නිවේදනයයි**

වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමේ දෙපාර්තමේන්තුවට අයත්, සියලුම රබර් මිළට ගැනීමේ ගබඩාවන් වාර්ෂික තොග සමීක්ෂණය වෙනුවෙන් 1974 ජනවාරි මස 1 වැනි සහ 2 වැනි දිනවලදී වසා තබනු ලබන බව සුළු රබර් වතු හිමියන්ගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

එම්. සී. සී. ප්‍රනාන්දු,
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ කොමසාරිස්.

වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව,
5 වැනි මහල, තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ල,
1973 දෙසැම්බර් 14 දින දීය.
කොළඹ 1.

12-362 —73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය**

බටහිර කොට්ඨාශය — කළුතර දිස්ත්‍රික්කය

**පානදුර ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු කාර්යාලය.**

ගමනාගමනයට බාධා

**වස්කඩුව-බණ්ඩාරගම පාරේ 6/2 දරණ පාලම ප්‍රතිසංස්කරණය කිරීම**

වස්කඩුව-බණ්ඩාරගම පාරේ 6/2 දරණ පාලම ප්‍රතිසංස්කරණය කරන බැවින්, වැඩ නිමවී නැවත දන්වන තුරු, එම මාගීය 6/2 පාලම අසල වසා තබන් බව මහජනයා වෙත මෙයින් දන්වනු ලැබේ.

2. මේ වෙනුවට බණ්ඩාරගම සහ මොරොන්තුඩුව අතර විකල්ප මාර්ගය වශයෙන් වාහන සඳහා බණ්ඩාරගම - පානදුර - වාද්දුව මොරොන්තුඩුව පාර පාවිච්චි කළ හැක.

බී. සී. එච්. මෙන්ඩිස්,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවා සංවිධානය,
බටහිර් දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
1973 දෙසම්බර් මස කොළඹ 7.

12-414 —73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

**1974 වර්ෂයේ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සේන් ගොවිතැන යටතේ තුන් අවුරුදු බදු ක්‍රමයට තේක්ක සහ වෙනත් කැලෑ ගස් වර්ග ප්‍රතිරෝපණය සඳහා ඉඩම් වෙන් කිරීම**

1973 ඔක්තෝබර් මස 26 දින ඉහත සඳහන් ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පමුණුවන්ට ලැබුණු ඉහත සඳහන් දැන්වීම පිළිබඳවයි. 1974 වර්ෂයේ පොලොන්නරු දිස්ත්‍රික්කය තුළ නැවත වන වගා සඳහා ඉඩම් වෙන් කර ඇත්තේ එකී දැන්වීමේ සඳහන් පරිදි ගල්ඔය යෝජිත රක්ෂිත වනයෙන් සහ අඹගස්වැව රජයේ අවශේෂ කැලයෙන්ද නොව ආනඹළුන්දව යෝජිත රක්ෂිත වනයෙනි. (අක්. 1,000) ආනඹළුන්දව යෝජිත රක්ෂිත වනයේ නැවත වන වගා සඳහා ඉල්ලුම්පත් යැවිය යුත්තේ ත්‍රිකුණාමලයේ උතුරු මැද දිසාවේ, දිසා වන නිලධාරි වෙතය. ගල්ඔය සහ අඹගස්වැව කැලෑවලින් ඉඩම් ලබා ගැනීම සඳහා මීට ප්‍රථමයෙන් ඉදිරිපත් කර ඇති ඉල්ලුම්පත්වලට ආනඹළුන්දව යෝජිත රක්ෂිත යෙන් ඉඩම් ලබාදීම ගැන සළකා බලනු ලැබේ.

2. 1974 වර්ෂයේදී නැවත වන වගා සඳහා මුදා හැරීමට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පහත සඳහන් අමතර ප්‍රදේශයන් හිද ඉඩම් වෙන් කරනු ලැබේ:—

| | | අක්කර |
|---|---|---|
| පදවිය රක්ෂිත වනය | ... | ... 100 |
| කහල්ල රක්ෂිත වනය | ... | ... 200 |
| ඉසින්බැස්ස වැව රක්ෂිත වනය ... | | ... 125 |

මෙම ඉඩම් ලබාගැනීම සඳහා එවන ඉල්ලුම්පත්ද ත්‍රිකුණාමලයේ දිසා වන නිලධාරි වෙත 1974 ජනවාරි මස 15 දිනට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය. අපේක්ෂිත ඉල්ලුම්කරුවන් වැඩි විස්තර සඳහා 1973 ඔක්තෝබර් මස 26 දින දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ ඇති දැන්වීම බලන්න.

එල්. සී. ඒ. ද එස්. විජේසිංහ,
වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 509,
කොළඹ 2.

12-420 —73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

---

## "සුරාබදු ආඥපනත" පිළිබඳ දැන්වීම්

**1974 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා රා රේන්ද විකිණීමේ කොන්දේසි**

1973 නොවැම්බර් මස 09 වෙනි දින අංක 85 දරන ගැසට් පත්‍රයේ පලකරනලද, 1974 වර්ෂය හා ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා රා රේන්ද විකිනීමේ කොන්දේසි මාලාවේ අංක 3 දරන විශේෂ කොන්දේසිය, පහත දැක්වෙන කොන්දේසිය අංක 4 දරන උප කොන්දේසිය වශයෙන් යෙදීමෙන් සංශෝධනය විය යුතුයයි, (52 වැනි අධිකාරය වන) සුරාබදු ආඥපනතේ 19 වෙනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සුරාබදු කොමසාරිස් හේරත් බණ්ඩා විජේකෝන් වන මම, මුදල් ඇමතිවරයාගේ ද අනුමැතිය ඇතිව මෙයින් විධානය කරමි.

"යාපනේ දිස්ත්‍රික්කයේ තැබෑරුම්වල රා සිල්ලරට විකිනීමේ නනි වරප්‍රසාද සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලබන්නේ, ලියාපදිංචි කරනලද, යාපනේ දිස්ත්‍රික්කයේ රා නිෂ්පාදනය කිරීමේ සහ අලෙවි කිරීමේ සමුපකාර සමිතිවලට පමණකි."

හේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

1973 දෙසැම්බර් මස 03 දින,
කොළඹ—1.

12-437 —73.12.14 දින අංක 90 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

**සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල** පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩ කරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාර ගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළයුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය** සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ** මහලේකම් **කාර්යාල** ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර් **යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ. යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|---|
| දෙසැම්බර් | ... | 73.12.07 සිකුරාද | ... | 73.11.30 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.14 සිකුරාද | ... | 73.12.07 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.21 සිකුරාද | ... | 73.12.14 සිකුරාද | දවල් 12.00 |
| | | 73.12.28 සිකුරාද | ... | 73.12.21 සිකුරාද | දවල් 12.00 |

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
**ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.**

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.